

# පාළි පදමාලාව
# හෙවත්
# පාළි වරනැඟිල්ල.



# පාලි පදමාලාව

— — හෙවත් — —

# පාලි වරනැගිල්ල — —

ප්‍රතිපාදක-

චන්ද්‍රකීර්ත්ති ශ්‍රී පියරතන

පණ්ඩිත ස්ථවිර

---

ප්‍රකාශකයෝ-

ඇම්. ඩී. ඇස්. සුවදරත්න

සහ

ඒ. ඩී. ඇස්. සුවදරත්න

---

2479

1935

---

මිල ශත 60 යි.

# පාලි පදමාලාව

හෙවත්

# පාලි වරනැගිල්ල

කෝට්ටගොඩ
සෞගතෝදය විද්‍යාලයාචාර්‍ය්‍ය, කහදමෝදර
චන්ද්‍රකීර්ත්ති ශ්‍රී පියරතන
පණ්ඩිත ස්වාමීන් වහන්සේ විසින්
ප්‍රතිපාදිතයි.

---

මිරිස්සේ පොල්වතුමෝදර
ඇම්. ඩී. ඇස්. සුවදරත්න සහ ඒ. ඩී. ඇස්. සුවදරත්න
යන සහෝදර මහතුන් විසින්
ප්‍රකාශිතයි.

කොළඹ මාලිගාකන්ද පාරේ
"ශ්‍රීපති" යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

(All Rights Reserved)

2479
1935

සුවදරත්න සහෝදරයෝ.
බෙලිඅත්ත.

# සංඥාපනය

---

ලක්දිව පාළිභාෂාව ඉගෙනීමට බස්නා ආධුනිකයාට පළමු කොටම අතපොත් තබන පොත පාළිවරනැඟිල්ල බව චිරප්‍රසිද්ධය. එය ව්‍යාකරණය අතින් විභක්ති කාල කාරකාදියට නාම හා ධාතූන් නිසිසේ වරනැඟෙන අයුරුද, කෝෂය (භාෂාව) අතින් සහස්‍රාධික පාළිවචන රාශියක්ද ස්වල්ප කාලයකදී ශිෂ්‍යයාට උගන්වයි. පාළි වරනැඟිල්ලේ කෘපාකටාක්ෂය නිසිසේ ලැබූ (උද්ග්‍රහණ ධාරණාදිය කළ) ශිෂ්‍යයා ඉන් ඔබ්බෙහි හදාරන ව්‍යාකරණ හා භාෂාව පිළිබඳ පාඩම් වලදී නොපැකිළෙන්නෙක් වෙයි. නුමුළාවන්නෙක්ද වෙයි

සාමාන්‍ය ව්‍යවහාරයෙහි පාළිවරනැඟිල්ල යනුවෙන් පහසුවෙන් අඳුන්වනු ලබන ඒ නාමපදමාලාව බාලාවතාරය ඇසුරු කොට පුරාතන ප්‍රවීණ ආචාර්යවරයෙකු විසින් සංගෘහිතය. සමාන ශබ්ද ඇතුළත් ගාථාපාඨ රූපසිද්ධියෙන් උද්ධෘතය. පාළි භාෂා ප්‍රවේශයේ මුල් පියවරෙහිදී ලක්දිව ශ්‍රේෂ්ඨ පඬිවරයාගේ අතෙහි පවා කිසියම් දවසෙක දක්නා ලද්දේ මේ පොතය. ආචාර්යවරයා ස්වකීය දහර ශිෂ්‍යයා පිළිබඳ අනාගත විශිෂ්ට ඵලිත හැඟීම් රැසක් ඇතිකරගත්තේ මේ පොතෙනිය. නැත හොත් පළමුකොටම ඔහුගේ නුවණ ඇති නැති බව මැන ගත්තේ මේ පොතෙනිය.

මෙය බාලාවතාර ක්‍රමය ගුරුකොට ගන්නාලද්දක් බැවින් එහි වූ ශබ්ද පමණක් වරනගා දැක්වීම තත්කාලීනපාදයන්හට අභිමත විය. එසේ වුවද උක්තානුසාරයෙන් නොගතහැකි විශේෂ ක්‍රමයෙන් වරනැඟෙන තවත් බොහෝ ශබ්ද භාෂාවෙහි පවත්නා බැවින් එබඳු ශබ්ද වරනැඟෙන අයුරු දැනගැනීමට ශිෂ්‍යයාට නොයෙක් පෙළ වියරණ පොත් බලන්ට සිදුවනු නොරහසකි. එසේ හෙයින් ඒ පුරාතන නාමපද මාලාවට ප්‍රතිසංස්කරණයක් දියයුතුව තිබුණු බව මේ **පාළි පදමාලාව** බැලීමෙන් වැටහේමැයි.

මෙය වනාහි සාකල්‍යයෙන් අපගේම යයි කියහැකි කෘතියක් නොවතුදු ඒ පුරාතන පාළිවරනැඟිල්ල පිළිබඳ සකස් කිරීමකි. එහි නොදක්නා බ්‍රහ්ම-සඛ-පුම-යුව-සා-කම්ම-චම්ම-යනාදි ශබ්ද ඒ ඒ පොත්වලින් සංග්‍රහ කොට මෙහි දක්වන ලදී. සුදුසු තන්හි ඇතැම් ශබ්ද පිළිබඳ විශේෂස්ථාන හා විස්තරද දක්වා ඇත. ශබ්ද සංග්‍රහ ගාථා හා සමාන ශබ්ද ඇතුළත් ඇතැම් ගාථාද යොදනලදී. ආඛ්‍යාත කාණ්ඩයෙහිදී ගමු ධාතුව අෂ්ට විභක්තීන්හි වරනැඟීම

**සහ ආදර්ශක්‍රියාරූප මාලාවක්ද** සවිස්තර සුගම **ආඛ්‍යාත ව්‍යාඛ්‍යාවක්ද** අප විසින් ලියනලදි ශබ්ද වරනැඟීම් අවස්ථා වෙහි දක්වන්ට නොහැකි වුණු අස්ම-අඩ-මුඩ-වත්තහ-රහ-දළ්හ ධම්ම-විවටච්ඡද වුත්තසිර යන ශබ්දයන්ගේ වරනැඟීම **පරිශිෂ්ට සංග්‍රහයක්** වශයෙන් යොදා ඇත.

බාලාවතාර-රූපසිද්ධි-මොග්ගල්ලායන-ශබ්දනීති ආදි පාළි ව්‍යාකරණ ග්‍රන්ථ කීපයක් ආශ්‍රිතව සකස් කරන ලද මේ පාළිපද මාලාව ශබ්ද වරනැඟීම සම්බන්ධයෙන් පොත් කීපයක් බැලීමෙන් ගතයුතු ප්‍රයොජනය සලසා දෙයි. එබැවින් පිරිවෙන්වල හා පාළි උගන්වන පාඨශාලාවල ශිෂ්‍යයන්ට මෙයින් මහත් පහසුවක් සිද්ධ වනු නිසැකය.

මනො ගණයෙහිවූ ශබ්ද නපුංසක ලිඞ්ගයෙහි පමණක් නොව පුල්ලිඞ්ගයෙහිද යෙදෙන බව ශබ්දනීතිකාරාදි ප්‍රශස්ත ආචාර්‍යවර යන්ගේ පිළිගැන්ම බැවින් මේ පාළිපදමාලාවද ඒ මගම ගත්තීය. ගො ශබ්දය පුංස්ත්‍රී ලිඞ්ගවයෙහි වරනඟන ලදුයේත් එහෙයිනි. ඇතැම් ශබ්ද පිළිබඳව රූපසිද්ධි මොග්ගල්ලායන ශබ්දනීති යන ව්‍යාකරණයන්හි ස්වල්ප විසදෘශතා දක්නා ලැබේ. එබඳු තන්හි අප අනුගමනය කළේ රූපසිද්ධියයි. හෙද ප්‍රාසිකා වශයෙනි. සා ශබ්දයේ වරනැඟීම රූපසිද්ධියෙහි දැක්වූ අයුරු ජිනවචනානුගත නොවන බැවින් එහිදී ශබ්දනීති ක්‍රමය අනුගමනය කොළෙමු.

මේ පාළිපදමාලාව සම්පාදනය කිරීමට අප වෙත ආරාධනා කළාවූද අප හිතෛෂී මිත්‍රවූද මිරිස්සේ වෙළුවනාරාමාධිපතිව වැඩ සිට මේ නොබෝදා දිවඞ්ගත ගෞරවාර්හ **පොල්වත්තුමෝදර ශ්‍රී විපුලතිෂ්‍ය** ස්ථවිරයන් වහන්සේ මෙහිදී කෘතඥතා පූර්වකව අනුස්මරණය කරම්හ. මේ පොත මුද්‍රණයෙන් ප්‍රකාශයට පැමිණවූ මිරිස්සේ හේන්වල රත්නගිරියේ **ඇම්. ඩී. ඇස්. සුවඳරත්න**, පොල්වත්තුමෝදර සුවඳාගාරයෙහි **ඒ. ඩී. ඇස්. සුවඳරත්න** යන සහෝදර මහතුන් දෙපල වෙත අපගේ ප්‍රශංසාව පිරිනැමේ.

මෙය මුද්‍රණාවස්ථාවෙහි මුද්‍රණීය පත්‍ර බලාදීම් ආදිය ගැන අප ශිෂ්‍ය **කෝට්ටගොඩ නාරද** නමගෙන් ලැබුණු සහාය අපගේ පරිශ්‍රමලාඝවයට හෙතුවිය.

මේවගට,

**කහඳමෝදර චන්ද්‍ර කීර්ති ශ්‍රී**
**පියරතන පණ්ඩිත ස්ථවිර.**
ප්‍රතිපාදක.

2479
—— දෙසැම්බර 20.
1935

# ප්‍රකාශක නිවේදනය

පාළිභාෂාවතරණයට ප්‍රථම සොපාණයක් වැනි මේ පාළිපද මාලා නම්වූ පාළිවරනැගිල්ල කෝට්ටගොඩ සෞගතොදය විද්‍යාලයාචාර්‍ය්‍ය කහදූමෝදර **චන්ද්‍රකීර්ති ශ්‍රී පියරතන** පණ්ඩිත ස්වාමීන් වහන්සේ විසින් අපගේ ප්‍රිය සහෝදරවූ දිවඞ්ගතවී වදාළ **පොල්වතුමෝදර සිරි විපුලතිස්ස** ස්වාමීන් වහන්සේගේ ආරාධනාවෙන් සම්පාදිතව අප විසින් මුද්‍රණය කරවා ප්‍රසිඩ කරන ලදි.

නොයෙක් පොත් වලින් සංග්‍රහ කරනලද අතිරේක ශබ්ද රාශියක් මෙහි ඇතුළත් බැවින් පාළිභාෂාව හදාරන ආධුනිකයන්ට මෙයින් මහත් ප්‍රයොජනයක් අත්පත් වේයයි විශ්වාස කරම්හ. යම් හෙයකින් ඒ අතිරේක ශබ්ද ප්‍රථම ප්‍රවෙශයෙහිදී ශිෂ්‍යයාට පාඩම් කරවීම දුෂ්කර යයි යම් ආචාර්‍ය්‍ය කෙනෙකුන්හට හැඟේ නම් ඒ ශබ්ද අතහැර උවමනා ප්‍රමාණය පමණක් පාඩම් කරවීමටද මෙයින් බාධාවක් නොපැනේ. අද ලක්දිව බොහෝ බෞද්ධ උසස් පාඨශාලාවන්හිද පාළිභාෂාව උගන්වාගෙන යෑම ප්‍රීතියට කාරුණකි. පාඨශාලීය ශිෂ්‍යයන්ගේ භාවිතයට සුදුසු පොත් පෙළක් අවශ්‍යයෙන් ඇතිවිය යුතුය. ශබ්ද වරනැගීම සම්බන්ධව පා භාෂාවෙන් ලියවී තිබෙන නොයෙක් පොත් බලන්ට ඔවුන්ට අවකාශයක් නැත. එබැවින් ඒ පිළිබඳ මෙබඳු සංග්‍රහ පොතක් ඇතිවීම ඔවුන්ට මහත් පහසුවකි. පාරිවෙණික ශිෂ්‍යයන්ටද එය පහසුවක් වනු කියනුම කිම.

මේ පොත ඉතා ස්වල්ප කාලයක් තුළදී ශොභනාකාරයෙන් මුද්‍රණය කරදුන් කොළඹ මාලිගාකන්දපාරේ "ශ්‍රීපති" යන්ත්‍රාලයේ **ආර්. ඩබ්ලිව්. ඩී. සල්මන් අප්පුහාමිට** අප විසින් ස්තුති කටයුතුය.

මේ පොතේ නැවත මුද්‍රණය කර්තෘ ස්වාමීන් වහන්සේගේ අවසරය පරිදි සිදුවිය යුතුවේ.

මීට,

ඇම්. ඩී. ඇස්. සුවඳරත්න
ඒ. ඩී. ඇස්. සුවඳරත්න

1935 දෙසැම්බ 20.

ප්‍රකාශකයෝ.

# පදරූප කථනය

---

## අකාරාන්ත බුද්ධ ශබ්දය

ප්‍රථමා – බුද්ධො–සර්වඥ තෙම
බුද්ධා–සර්වඥයෝ තුමූ
ආලපන – (හෙ) බුද්ධ, බුද්ධා–පින්වත් සර්වඥය!
(භවන්තො) බුද්ධා–පින්වත් සර්වඥයෙනි!
ද්විතීයා – බුද්ධං–සර්වඥයා
බුද්ධෙ–සර්වඥයන්
තෘතීයා – බුද්ධෙන–සර්වඥයා විසින්
බුද්ධෙභි, බුද්ධෙහි–සර්වඥයන් විසින්
කරණ – බුද්ධෙන–සර්වඥයා කාරණකොටගෙන
බුද්ධෙභි, බුද්ධෙහි–සර්වඥයන් කාරණකොටගෙන
චතුර්ථී– බුද්ධාය, බුද්ධස්ස–සර්වඥයාට
බුද්ධානං–සර්වඥයන්ට
පඤ්චමී – බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා–සර්වඥයා කෙරෙන්
බුද්ධෙභි, බුද්ධෙහි–සර්වඥයන් කෙරෙන්
ෂෂ්ඨී – බුද්ධස්ස–සර්වඥයාගේ
බුද්ධානං–සර්වඥයන්ගේ
සප්තමී – බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං–සර්වඥයා කෙරෙහි
බුද්ධෙසු–සර්වඥයන් කෙරෙහි

---

## අකාරාන්ත අත්ත ශබ්දය

ප්‍ර – අත්තා–ආත්මය තෙම
අත්තානො–ආත්මයෝ තුමූ
ආ – (හෙ) අත්ත, අත්තා–පින්වත් ආත්මය!
(භවන්තො) අත්තානො–පින්වත් ආත්මයෙනි!
ද්වි අත්තානං, අත්තං–ආත්මය
අත්තානො–ආත්මයන්
තෘ – අත්තෙන, අත්තනා–ආත්මය විසින්
අත්තනෙභි, අත්තනෙහි–ආත්මයන් විසින්
ක – අත්තෙන, අත්තනා ආත්මය කාරණකොටගෙන
අත්තනෙභි, අත්තනෙහි–ආත්මයන් කාරණකොටගෙන
ච – අත්තනො–ආත්මයට
අත්තානං–ආත්මයන්ට
ප – අත්තනා, අත්තම්හා, අත්තස්මා–ආත්මය කෙරෙන්
අත්තනෙභි, අත්තනෙහි ආත්මයන් කෙරෙන්
ෂ – අත්තනො–ආත්මයාගේ
අත්තානං–ආත්මයන්ගේ
ස – අත්තනි–ආත්මය කෙරෙහි
අත්තනෙසු–ආත්මයන් කෙරෙහි

රාජ බ්‍රහ්මාදි සෙසු ශබ්දයන්ගේද පදරූප කථනය මෙකී අනුසාරයෙන්ම දතයුතුයි.

# ශුද්ධි පත්‍රය.

| පිට. | පෙළ | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 11 | 25 | ඡායා. | ජයා |
| 41 | 2 | ණපෙ-ණපය | ණාපෙ-ණාපය. |
| ,, | 35 | සෙදයං. | සෙදය්‍යං. |
| 63 | 21 | කාරක. | කාරකං. |
| 71 | 32 | භාවකාරකය වේ | භාවකාරකය මෙසේයි. |

# පාලි පදමාලාව

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

## පුල්ලිඞ්ග ශබ්ද

### අකාරාන්ත බුද්ධ ශබ්දය

| විභක්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථමා – | බුද්ධො | බුද්ධා |
| ආලපන – | (හෙ) බුද්ධ, බුද්ධා | (භවන්තො) බුද්ධා |
| ද්විතීයා – | බුද්ධං | බුද්ධෙ |
| තෘතීයා – | බුද්ධෙන | බුද්ධෙභි, බුද්ධෙහි |
| කරණ – | බුද්ධෙන | බුද්ධෙභි, බුද්ධෙහි |
| චතුර්ථී – | බුද්ධාය, බුද්ධස්ස | බුද්ධානං |
| පඤ්චමී – | බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා | බුද්ධෙභි, බුද්ධෙහි |
| ෂෂ්ඨී – | බුද්ධස්ස | බුද්ධානං |
| සප්තමී – | බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං | බුද්ධෙසු |

### බුද්ධ ශබ්දයෙන් සදෘශයන් කියත්.

එවං සුරා'සුර නරෝ'රග නාග යක්ඛ
ගන්ධබ්බ කින්නර මනුස්ස පිසාච පෙතා
මාතඞ්ග ජඞ්ගම තුරඞ්ග වරාහ සීහ
ව්‍යග්ඝ'ච්ඡ කච්ඡප තරච්ඡ මිග'ස්ස සොණා

ආලොක ලොක නිලයා'නිල චාග යොග
වායාම ගාම නිගමා'ගම ධම්ම කාමා
සඞ්ඝො'ස ඝොස පටිඝා'සව කොධ ලොභ
සාරම්භ ථම්භ මද මාන පමාද මක්ඛා

පුන්නාග පූග පනසා'සන චම්පකා'ම්බ
හින්තාල තාල වකුල'ජ්ජුන කිංසුකා ච
මන්දාර කුන්ද පුචිමන්ද කරඤ්ජ රුක්ඛා
සෙය්‍යා මයූර සකුණ'ණ්ඩජ කොඤ්ච හංසා

**ඉච්චාදයො බුද්ධ සද්දා'ව.**

**විශේෂ:-**

මේ බුද්ධ ශබ්දය මෙන්ම වරනැඟිය යුතු **ගුම්බ-වත්තබ්බ-ඒකච්ච-පඨම-කොධ-අත්ථ*** යන ශබ්දයන්ගේ ඇතැම් විභක්තීන්හි ස්වල්ප විසදෘශතා දක්නා ලැබේ. එනම්:- ගුම්බ-වත්තබ්බ ශබ්දයන්ගේ ප්‍රථමා ඒකවචනයෙහි

ගුම්බෝ, ගුම්බෙ (ගුම්බෝ)
වත්තබ්බෝ, වත්තබ්බෙ (වත්තබ්බෝ)

යනුවෙන් **ගුම්බෙ-වත්තබ්බෙ** යනුද, ඒකච්ච-පඨම ශබ්දයන්ගේ ප්‍රථමා ආලපන බහුවචනයන්හි

(ඒකච්චෝ) ඒකච්චෙ
(හෙ ඒකච්ච, ඒකච්චා) භවන්තො ඒකච්චෙ
(පඨමෝ) පඨමෙ
(හෙ පඨම, පඨමා) භවන්තො පඨමෙ

යනුවෙන් **ඒකච්චෙ පඨමෙ** යනුද, කොධ අත්ථ ශබ්දයන්ගේ තෘතීයා කාරණ ඒකවචනයන්හි

**කොධසා,** කොධෙන (කොධෙහි, කොධෙභි)
**අත්ථසා,** අත්ථෙන (අත්ථෙහි, අත්ථෙභි)

යනුවෙන් **කොධසා අත්ථසා** යනුද, බුද්ධ ශබ්දයට වඩා වෙනසි. සෙස්ස බුද්ධ ශබ්දය මෙනි.

---

## අකාරාන්ත අත්ත ශබ්දය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | අත්තා | අත්තානො |
| ආ – | (හෙ) අත්ත, අත්තා (භවන්තො) | අත්තානො |
| ද්වි – | අත්තානං, අත්තං | අත්තානො |
| තෘ – | අත්තෙන, අත්තනා | අත්තනෙහි, අත්තනෙභි |
| කා – | අත්තෙන, අත්තනා | අත්තනෙහි, අත්තනෙභි |
| ච – | අත්තනො | අත්තානං |
| පං – | අත්තනා, අත්තමහා, අත්තස්මා | අත්තනෙහි, අත්තනෙභි |
| ෂ – | අත්තනො | අත්තානං |
| ස – | අත්තනි | අත්තනෙසු |

**අත්ත ශබ්දයෙන් ආත්මය කියත්.**

---

* ගුම්බ, වන ලැහැබය; වත්තබ්බ, අනුශාසනා කටයුත්තේය; ඒකච්ච, ඇතැම් කෙනෙක්ය; පඨම, ප්‍රථමයාය; කොධ, ක්‍රෝධය; අත්ථ, ධනය හෝ කාරණය.

සංලක්ෂ්‍ය:—

ආතුම ශබ්දයේ **ප්‍රථමා ආලපන ද්විතීයා** විභක්ති අත්ත ශබ්දය මෙනි. තෘතීයාව පටන් සෙස්ස බුම ශබ්දය මෙනි.

---

## අකාරාන්ත රාජ ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | රාජා | රාජානො |
| ආ – | (හෙ) රාජ, රාජා | (භවන්තො) රාජානො |
| ද්වි – | රාජානං, රාජං | රාජානො |
| තෘ – | රඤ්ඤා, රාජෙන | රාජූභි, රාජූහි, රාජෙභි, රාජෙහි |
| ක – | රඤ්ඤා, රාජෙන | රාජූභි, රාජූහි, රාජෙභි, රාජෙහි |
| ච – | රඤ්ඤො, රාජිනො | රඤ්ඤං, රාජූනං, රාජානං |
| ප – | රඤ්ඤා, රාජම්හා, රාජස්මා | රාජූභි, රාජූහි, රාජෙභි, රාජෙහි |
| ෂ – | රඤ්ඤො, රාජිනො | රඤ්ඤං, රාජූනං, රාජානං |
| ස – | රඤ්ඤෙ, රාජිනි<br>රාජම්හි, රාජස්මිං | රාජූසු, රාජෙසු |

**රාජ ශබ්දයෙන් රජුන් කියත්.**

---

## අකාරාන්ත බ්‍රහ්ම ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | බ්‍රහ්මා | බ්‍රහ්මානො |
| ආ – | (හෙ) බ්‍රහ්ම, බ්‍රහ්මා, බ්‍රහ්මෙ | (භවන්තො) බ්‍රහ්මානො |
| ද්වි – | බ්‍රහ්මානං, බ්‍රහ්මං | බ්‍රහ්මානො |
| තෘ – | බ්‍රහ්මුනා | බ්‍රහ්මෙභි, බ්‍රහ්මෙහි, බ්‍රහ්මූභි, බ්‍රහ්මූහි |
| ක – | බ්‍රහ්මුනා | බ්‍රහ්මෙභි, බ්‍රහ්මෙහි, බ්‍රහ්මූභි, බ්‍රහ්මූහි |
| ච – | බ්‍රහ්මුනො, බ්‍රහ්මුස්ස,<br>බ්‍රහ්මස්ස | බ්‍රහ්මූනං, බ්‍රහ්මානං |
| ප – | බ්‍රහ්මුනා | බ්‍රහ්මෙභි, බ්‍රහ්මෙහි, බ්‍රහ්මූභි, බ්‍රහ්මූහි |
| ෂ – | බ්‍රහ්මුනො, බ්‍රහ්මුස්ස,<br>බ්‍රහ්මස්ස | බ්‍රහ්මූනං, බ්‍රහ්මානං |
| ස – | බ්‍රහ්මනි | බ්‍රහ්මෙසු |

**බ්‍රහ්ම ශබ්දයෙන් බ්‍රහ්මයන් කියත්.**

## අකාරාන්ත සඛ ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | සඛා | සඛායො, සඛානො, සඛිනො |
| ආ – | (හෙ)සඛ, සඛා, සඛි, සඛී, සඛෙ, | (භවන්තො) සඛායො, සඛානො, සඛිනො |
| ද්වි – | සඛානං, සඛාරං, සඛං | සඛායො, සඛානො, සඛිනො |
| තෘ – | සඛිනා | සඛාරෙහි, සඛාරෙභි, සඛෙහි, සඛෙභි |
| ක – | සඛිනා | සඛාරෙහි, සඛාරෙභි, සඛෙහි, සඛෙභි |
| ච – | සඛිනො, සඛිස්ස | සඛාරානං, සඛීනං |
| ප – | සඛිනා | සඛාරෙහි, සඛාරෙභි, සඛෙහි, සඛෙභි |
| ෂ – | සඛිනො, සඛිස්ස | සඛාරානං, සඛීනං |
| ස – | සඛෙ | සඛාරෙසු, සඛෙසු |

**සඛ ශබ්දයෙන් යහළුවන් කියත්.**

---

## අකාරාන්ත පුම ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | පුමා | පුමානො |
| ආ – | හෙ)පුමං, පුම, පුමා, (භවන්තො) | පුමානො |
| ද්වි – | පුමානං, පුමං | පුමානො |
| තෘ – | පුමානා, පුමුනා, පුමෙන | පුමානෙහි, පුමානෙභි |
| ක – | පුමානා, පුමුනා, පුමෙන | පුමානෙහි, පුමානෙභි |
| ච – | පුමුනො; පුමස්ස | පුමානං |
| ප – | පුමානා, පුමුනා | පුමානෙහි, පුමානෙභි |
| ෂ – | පුමුනො, පුමස්ස | පුමානං |
| ස – | පුමෙ, පුමානෙ, පුමම්හි, පුමස්මිං | පුමාසු, පුමෙසු |

**පුම ශබ්දයෙන් පුරුෂයන් කියත්.**

---

## අකාරාන්ත යුව ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | යුවා | යුවානො, යුවානා |
| ආ – | (හෙ)යුව, යුවා, යුවාන, යුවානා, | (භවන්තො) යුවානො, යුවානා |
| ද්වි – | යුවානං, යුවං | යුවානෙ, යුවෙ |
| තෘ – | යුවානා, යුවෙන, යුවානෙන | යුවානෙහි, යුවානෙභි, යුවෙහි, යුවෙභි |

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ක – | යුවානා, යුවෙන, යුවානෙන | යුවානෙභි, යුවානෙහි, යුවෙභි, යුවෙහි |
| ච – | යුවානස්ස, යුවස්ස | යුවානානං, යුවානං |
| ප – | යුවානා, යුවානම්හා, යුවානස්මා | යුවානෙභි, යුවානෙහි, යුවෙභි, යුවෙහි |
| ෂ – | යුවානස්ස, යුවස්ස | යුවානානං, යුවානං |
| ස – | යුවානෙ, යුවානම්හි, යුවානස්මිං යුවෙ, යුවම්හි, යුවස්මිං | යුවානෙසු, යුවෙසු, යුවාසු |

**යුව ශබ්දයෙන් තරුණයන් කියත්.**

මඝව ශබ්දයද මෙසේමැයි.

---

## අකාරාන්ත මන ශබ්දය.

| | | |
|---|---|---|
| ප්‍ර – | මනො | මනා |
| ආ – | (හෙ) මන, මනා (භවන්තො) | මනා |
| ද්වි – | මනං, මනො, | මනෙ |
| තෘ – | මනසා, මනෙන | මනෙභි, මනෙහි |
| ක – | මනසා, මනෙන | මනෙභි, මනෙහි |
| ච – | මනසො, මනස්ස | මනානං |
| ප – | මනසා, මනා, මනම්හා, මනස්මා | මනෙභි, මනෙහි |
| ෂ – | මනසො, මනස්ස | මනානං |
| ස – | මනසි, මනෙ, මනම්හි, මනස්මිං | මනෙසු |

**මන ශබ්දයෙන් සිත කියත්.**

---

එවං තමො තපො තෙජො–වචො ඔජො උරො සිරො
රජෝ යසො පයො චෙතො–සරො වාසො වයො අයො
ජලාසයෙ සරො හොති– අයො ලොහෙ යදක්ඛයෙ
ඔඝො ගන්ධයොජා පදෙ වාසො– ඔකො චෙතො ඔකාදිසු

## අකාරාන්ත ගුණවන්තු ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | ගුණවා | ගුණවන්තො, ගුණවන්තා |
| ආ – | (හෙ) ගුණවං, ගුණව, ගුණවා | (භවන්තො) ගුණවන්තො, ගුණවන්තා |
| ද්වි – | ගුණවන්තං | ගුණවන්තෙ |
| තෘ – | ගුණවතා, ගුණවන්තෙන | ගුණවන්තෙහි, ගුණවන්තෙභි |
| ක – | ගුණවතා, ගුණවන්තෙන | ගුණවන්තෙහි, ගුණවන්තෙභි |
| ච – | ගුණවතො, ගුණවන්තස්ස | ගුණවතං, ගුණවන්තානං |
| ප – | ගුණවතා, ගුණවන්තම්හා, ගුණවන්තස්මා | ගුණවන්තෙහි, ගුණවන්තෙභි |
| ඡ – | ගුණවතො, ගුණවන්තස්ස | ගුණවතං, ගුණවන්තානං |
| ස – | ගුණවති, ගුණවන්තෙ, ගුණවන්තම්හි, ගුණවන්තස්මිං | ගුණවන්තෙසු |

## ගුණවන්තු ශබ්දයෙන් ගුණවතුන් කියත්

එවං මඝවා, කුලවා, ඵලවා, යසවා, ධනවා, සුතවා, භගවා, හිමවා, බලවා, සීලවා, පඤ්ඤවා, සතිමා, ධිතිමා, ගතිමා, මතිමා, මුතිමා, ජුතිමා, සිරිමා, හිරිමා, ථුතිමා, රතිමා, යතිමා, සුහිමා, කාලිමා, බලිමා, කසිමා, රුචිමා, බුද්ධිමා, චක්ඛුමා, බන්ධුමා, හෙතුමා, සෙතුමා, කෙතුමා, රාහුමා, භානුමා, ඛාණුමා, විජ්ජුමා, පාපිමා, පුත්තිමා, ගණවා, චිවා, කතවා, හිතවා, සීතවා, රසම්වා, මස්සුවා, යතවා, ථාමවා, රසවා

## ඉච්චාදයො ගුණවන්තු සද්දසමා.

---

**විශෙෂ:—**

හිමවන්තු ශබ්දයේ ප්‍රථමා එකවචනයෙහි **හිමවා–හිමවන්තො** යි පද දෙකක් වේ.

සතිමන්තු-බන්ධුමන්තු ශබ්දයන්ගේ ද්විතීයා එකවචනයෙහි **සතිමං, සතිමන්තං–බන්ධුමං, බන්ධුමන්තං** කියාද එහිම චතුර්ථී ෂෂ්ඨී එකවචනයන්හි **සතිමස්ස, සතිමතො, සතිමන්තස්ස–බන්ධුමස්ස, බන්ධුමතො, බන්ධුමන්තස්ස** කියාද වෙතසි. සෙස්ස ගුණවන්තු ශබ්දය මෙනි.

## අකාරාන්ත ගච්ඡන්ත ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | ගච්ඡං, ගච්ඡන්තො, | ගච්ඡන්තො, ගච්ඡන්තා |
| ආ – | (හෙ)ගච්ඡං,ගච්ඡ,ගච්ඡා, | (භවන්තො)ගච්ඡන්තො,ගච්ඡන්තා |
| ද්වි – | ගච්ඡන්තං | ගච්ඡන්තෙ |
| තෘ – | ගච්ඡතා, ගච්ඡන්තෙන | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි |
| ක – | ගච්ඡතා, ගච්ඡන්තෙන | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි |
| ච – | ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| ප – | ගච්ඡතා, ගච්ඡන්තම්හා ගච්ඡන්තස්මා | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි |
| ෂ – | ගච්ඡතො,ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| ස – | ගච්ඡති, ගච්ඡන්තෙ, ගච්ඡන්තම්හි,ගච්ඡන්තස්මිං | ගච්ඡන්තෙසු |

### ගච්ඡන්ත ශබ්දයෙන් ගන්නවුන් කියත්.

එවං මහං චරං තිට්ඨං–දදං භුඤ්ජං සුණං පචං
ජයං ජීරං චවං මීයං–සරං කුබ්බං ජපං වජං

ඉච්ඡං පස්සං පිබං දිබ්බං–බුජ්ඣං රුන්ධං පචං හරං
චොරයං පාලයං රක්ඛං–දෙසයං මොචයං ලිඛං

## ඉච්චාදයො ගච්ඡන්ත සද්ද සමා.

**විශෙෂ:–**

සන්ත ශබ්දයද ගච්ඡන්ත ශබ්දය මෙනි. තෘතීයා-කරණ-පඤ්චමී බහුවචන යන්හි **සබ්භි–සන්තෙහි** යනු පමණක් වෙනසි.

---

## අකාරාන්ත භවන්ත ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | භවං | භොන්තො,භවන්තො,භවන්තා |
| ආ – | භො, භන්තෙ, භොන්ත, භොන්තා | භොන්තො, භවන්තො,භවන්තා |
| ද්වි – | භවන්තං | භොන්තෙ, භවන්තෙ |
| තෘ – | භොතා, භවතා, භවන්තෙන | භවන්තෙහි, භවන්තෙභි |
| ක – | භොතා, භවතා, භවන්තෙන | භවන්තෙහි, භවන්තෙභි |
| ච – | භොතො,භවතො,භවන්තස්ස | භවතං, භවන්තානං |
| ප – | භවතා, භවන්තම්හා, භවන්තස්මා | භවන්තෙහි, භවන්තෙභි |
| ෂ – | භොතො,භවතො,භවන්තස්ස | භවතං, භවන්තානං |
| ස – | භවති, භවන්තෙ, භවන්තම්හි භවන්තස්මිං | භවන්තෙසු |

### භවන්ත ශබ්දයෙන් පින්වතුන් කියත්.

## ආකාරාන්ත සා ශබ්දය

| | එකවචන | | බහුවචන |
|---|---|---|---|
| ප්‍ර – | සා | | සා, සානො |
| ආ – | (හෙ) ස, සා | (භවන්තො) | සා, සානො |
| ද්වි – | සානං | | සානෙ |
| තෘ – | සානා | | සානෙහි, සානෙභි |
| ක – | සානා | | සානෙහි, සානෙභි |
| ච – | සාස්ස | | සානං |
| ප – | සානා | | සානෙහි, සානෙභි |
| ෂ – | සාස්ස | | සානං |
| ස – | සානෙ | | සානෙසු |

**සා ශබ්දයෙන් ශුනකයන් කියත්.**

---

## ඉකාරාන්ත අග්ගි ශබ්දය

| | | | |
|---|---|---|---|
| ප්‍ර – | අග්ගි | | අග්ගී, අග්ගයො |
| ආ – | (හෙ) අග්ගි | (භවන්තො) | අග්ගී, අග්ගයො |
| ද්වි – | අග්ගිං | | අග්ගී, අග්ගයො |
| තෘ – | අග්ගිනා | | අග්ගීහි, අග්ගීභි |
| ක – | අග්ගිනා | | අග්ගීහි, අග්ගීභි |
| ච – | අග්ගිනො, අග්ගිස්ස | | අග්ගීනං |
| ප – | අග්ගිනා, අග්ගිම්හා, අග්ගිස්මා | | අග්ගීහි, අග්ගීභි |
| ෂ – | අග්ගිනො, අග්ගිස්ස | | අග්ගීනං |
| ස – | අග්ගිම්හි, අග්ගිස්මිං | | අග්ගිසු, අග්ගීසු |

**අග්ගි ශබ්දයෙන් ගිනි කියත්.**

ජොති පාණි ගණ්ඨි මුට්ඨි-කුච්ඡි වත්ථි සාලි වීහි
ව්‍යාධි ඔධි බොධි සන්ධි-රාසි කෙසි සාති දීපි

ඉසි මුනි මණි ධනි ගිරි රවි කවි කපි
අසි මසි නිධි විධි අහි කිමි පති හරි
අරි තිමි කලි බලි ජලනිධි ගහපති
උරුධිති වරමති නිරුපධි අධිපති

**ඉච්චාදයො අග්ගි සද්දා’ව.**

---

විශේෂ:-

i අග්ගි ශබ්දයේ ප්‍රථමා එකවචනයෙහි **අග්ගිනි** යන රූපයක් ලැබේ. අග්ගි ශබ්දය මෙන් වරනැගෙන සෙසු ශබ්දයන්ගේ එබඳු රූපයක් නොලැබේ.

ii ඉසි ශබ්දයේ ප්‍රථමා-ආලපන එකවචනයන්හි **ඉසෙ** යන්නක් ලැබේ. සෙස්ස අග්ගි ශබ්දය මෙනි.

---

## ඉකාරාන්ත ආදි ශබ්දය.

ආදි ශබ්දයේ සප්තමී එකවචනයෙහි **ආදිං, ආදෙ, ආදිම්හි, ආදිස්මිං** යනුවේ. සෙස්ස අග්ගි ශබ්දය මෙනි. ආදි ශබ්දයෙන් මර්යාදය, ප්‍රකාරය, සමීපය, අවයවය යන අර්ථ සතරක් කියත්.

---

## ඊකාරාන්ත දණ්ඩී ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | දණ්ඩී | දණ්ඩී, දණ්ඩිනො |
| ආ – | (භො) දණ්ඩි (භවන්තො) | දණ්ඩී, දණ්ඩිනො |
| ද්වි – | දණ්ඩිනං, දණ්ඩිං | දණ්ඩී, දණ්ඩිනො |
| තෘ – | දණ්ඩිනා | දණ්ඩීහි, දණ්ඩීභි |
| කා – | දණ්ඩිනා | දණ්ඩීහි, දණ්ඩීභි |
| ච – | දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| පං – | දණ්ඩිනා, දණ්ඩිම්හා, දණ්ඩිස්මා | දණ්ඩීහි, දණ්ඩීභි |
| ෂ – | දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| ස – | දණ්ඩිනි, දණ්ඩිම්හි, දණ්ඩිස්මිං | දණ්ඩීසු |

**දණ්ඩී ශබ්දයෙන් දඬුගත් පුරුෂයන් කියත්.**

ධම්මී සංඝී ඤාණී හත්ථී-චක්කී පක්ඛී දුඛී රථී
ඡත්තී මාලී වම්මී යොගී-භාගී භොගී කාමී සාමී
ධජී ගණී සසී කුඨී-ජටී යානී සුඛී සිඛී
දන්තී මන්තී කරී චාගී-කුසලී මුසලී බලී
පාපකාරී සත්තුකාරී-මාලාකාරී දීඝජීවී
ධම්මවාදී සීහනාදී-භූමිසායී සීඝයායී
කාබී පාණී යසස්සී ච-වජ්ජදස්සී ච තොමරී
සෙනානී ගාමණී මෙධී-චාරී අත්ථී හජ්ජී සුධී

**ඉච්චාදයො දණ්ඩී සද්ද සමා.**

---

2

**විශෙෂ:—**

ගාමණී-සෙනානී-සුධී ශබ්දයෝද දණ්ඩී ශබ්දය මෙනි. එහෙත් මේ ශබ්දයන්ගේ සප්තමී එකවචනයෙහි දණ්ඩී ශබ්දයෙහි ආ නි ආදෙශවත් රූප (ගාමණිනි-සෙනානිනි-සුධිනි යනු) නොලැබේ.

---

## උකාරාන්ත භික්ඛු ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | භික්ඛු | භික්ඛූ, භික්ඛවො |
| ආ – | (හෙ) භික්ඛු (නවනෙතා) | භික්ඛූ, භික්ඛවෙ, භික්ඛවො |
| ද්වි – | භික්ඛුං | භික්ඛූ, භික්ඛවො |
| තෘ – | භික්ඛුනා | භික්ඛූහි, භික්ඛූභි |
| කා – | භික්ඛුනා | භික්ඛූහි, භික්ඛූභි |
| ච – | භික්ඛුනො, භික්ඛුස්ස | භික්ඛූනං |
| ප – | භික්ඛුනා, භික්ඛුම්හා, භික්ඛුස්මා | භික්ඛූහි, භික්ඛූභි |
| ෂ – | භික්ඛුනො, භික්ඛුස්ස | භික්ඛූනං |
| ස – | භික්ඛුම්හි, භික්ඛුස්මිං | භික්ඛුසු, භික්ඛූසු |

**භික්ඛු ශබ්දයෙන් භික්ෂූන් කියත්.**

එවං සෙතු, කෙතු, භානු, රාහු, සංකු, උච්ඡු, වෙළු, මච්චු, සිඛු බන්ධු, නෙරු, මෙරු, සත්තු, කාරු, හෙතු, ජන්තු, රුරු, බාණු බබ්බු, පටු, ගරු

### ඉච්චාදයො භික්ඛු සද්ද සමා.

---

**විශෙෂ:—**

i හෙතු ශබ්දයද භික්ඛු ශබ්දය මෙනි. එසේ වුවද එහි ප්‍රථමා-ආලපන-ද්විතීයා බහුවචනයන්හි **හෙතුයො** යන රූපයක් වැඩිපුර යෙදෙයි.

ii ජන්තු ශබ්දයෙහිද ප්‍ර-ආ-ද් බහුවචනයන්හි **ජන්තුනො-ජන්තුයො** යන අතිරේක පද දෙකක් ලැබේ.

iii ගරු ශබ්දයේ ප්‍ර-ආ-ද් බහුවචනයන්හි **ගරූ-ගරවො-ගරුනො** කියැවේ. ඒ මෙසේයි:-

## උකාරාන්ත හෙතු ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | හෙතු | හෙතූ, හෙතවො, හෙතුයො |
| ආ – | (හෙ) හෙතු (නවනෙතා) | හෙතූ, හෙතවො, හෙතුයො |
| ද්වි – | හෙතුං | හෙතූ, හෙතවො, හෙතුයො |

සෙස්ස භික්ඛු ශබ්දය මෙනි.

**හෙතු ශබ්දයෙන් කාරණය කියත්.**

## උකාරාන්ත ජන්තු ශබ්දය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | ජන්තු | ජන්තූ, ජන්තවො, ජන්තුනො, ජන්තුයො |
| ආ –(භො) | ජන්තු (භවන්තො) | ජන්තූ, ජන්තවො, ජන්තුනො, ජන්තුයො |
| දු – | ජන්තුං | ජන්තූ, ජන්තවො, ජන්තුනො, ජන්තුයො |

සෙස්ස භික්ඛු ශබ්දය මෙනි.

**ජන්තු ශබ්දයෙන් සතාවුන් කියත්.**

---

## උකාරාන්ත ගරු ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | ගරු | ගරූ, ගරවො, ගරුනො |
| ආ –(භො) | ගරු (භවන්තො) | ගරූ, ගරවො, ගරුනො |
| දු – | ගරුං | ගරූ, ගරවො, ගරුනො |

සෙස්ස භික්ඛු ශබ්දය මෙනි.

**ගරු ශබ්දයෙන් ගුරුවරයන් කියත්.**

---

## උකාරාන්ත සත්ථු ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | සත්ථා | සත්ථාරො |
| ආ – | (භො) සත්ථ, සත්ථා (භවන්තො) | සත්ථාරො |
| දු – | සත්ථාරං | සත්ථාරෙ, සත්ථාරො |
| තෘ – | සත්ථාරා | සත්ථාරෙහි සත්ථාරෙභි |
| ක – | සත්ථාරා | සත්ථාරෙහි, සත්ථාරෙභි |
| ච – | සත්ථු, සත්ථුනො, සත්ථුස්ස | සත්ථාරානං, සත්ථානං |
| ප – | සත්ථාරා | සත්ථාරෙහි, සත්ථාරෙභි |
| ඡ – | සත්ථු, සත්ථුනො, සත්ථුස්ස | සත්ථාරානං, සත්ථානං |
| ස – | සත්ථරි | සත්ථාරෙසු |

**සත්ථු ශබ්දයෙන් ශාස්තෘන් කියත්.**

---

කත්තා ධාතා ගන්තා නෙත්තා–දාතා වත්තා චෙතා භාතා
ජෙත්තා ජෙතා හන්තා විකෙතා–චෙතා බොද්ධා ඤාතා සොතා

ගජ්ජිතා වස්සිතා භත්තා–මුච්ඡිතා පරිසෙයිතා
භාසිතා පුච්ඡිතා ඛන්තා–වුඪාතො'කාමිතා භාජා

නත්තා පනත්තා අක්ඛාතා- සහිතා පටිසෙවිතා
නෙතා විනෙතා මන්තා- සොධෙතා වසිතා හන්තා
උප්පාදෙතා විඤ්ඤාපෙතා-සංදස්සෙතා පබ්‍රෑහෙතා
බොධෙතා සාරෙතා චෙව-සඤ්ඤාවෙතා සාවෙතා ති.

## එවමාදයො සත්ථු සද්ද සමා.

**විශේෂ:—**

සත්ථු යනාදි මේ ශබ්දයන්ගේ චතුර්ථී ෂෂ්ඨී බහුවචනයෙහි සත්ථාරානං-සත්ථානං-සත්ථූනං යනුවෙන් **සත්ථුන්නං** යන ආදි රූපයකුදු ලැබේ. සත්ථු ශබ්දයේද එකී විභක්තීන්හි **සත්ථුනං** යන රූපයද තෘතීයා කරණ විභක්තීන්හි **සත්ථුනා** යන රූපයද ඇතැම්හු දක්වත්.

---

### උකාරාන්ත පිතු ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර - | පිතා | පිතරො |
| ආ - | (භො)පිත, පිතා (භවන්තො) | පිතරො |
| ද්වි - | පිතරං | පිතරෙ, පිතරො |
| තෘ - | පිතරා | පිතරෙහි, පිතරෙභි, පිතූහි, පිතූභි |
| කා - | පිතරා | පිතරෙහි, පිතරෙභි, පිතූහි, පිතූභි |
| ච - | පිතු, පිතුනො, පිතුස්ස | පිතරානං, පිතානං, පිතූනං |
| ප - | පිතරා | පිතරෙහි, පිතරෙභි, පිතූහි, පිතූභි |
| ෂ - | පිතු, පිතුනො, පිතුස්ස | පිතරානං, පිතාකං, පිතූකං |
| ස - | පිතරි | පිතරෙසු, පිතූසු |

### පිතු ශබ්දයෙන් පියවරුන් කියත්

භාතු ජාමාතු ශබ්දද පිතු ශබ්දය මෙනි.

---

### ඌකාරාන්ත අභිභූ ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර - | අභිභූ | අභිභූ, අභිභුවො |
| ආ - | (භො)අභිභූ (භවන්තො) | අභිභූ, අභිභුවො |
| ද්වි - | අභිභුං | අභිභූ, අභිභුවො |
| තෘ - | අභිභුනා | අභිභූහි, අභිභූභි |
| කා - | අභිභුනා | අභිභූහි, අභිභූභි |

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ච – | අභිභුනො, අභිභුස්ස | අභිභූනං |
| ප – | අභිභුනා, අභිභුම්හා, අභිභුස්මා | අභිභූහි අභිභූභි |
| ෂ – | අභිභුනො, අභිභුස්ස | අභිභූනං |
| ස – | අභිභුම්හි, අභිභුස්මිං | අභිභූසු |

**අභිභූ ශබ්දයෙන් මැඩපවත්වන්නවුන් කියත්.**

විභූ සයම්භූ සහභූ–ගොත්‍රභූ වත්‍රභූ පභූ
සබ්බාභිභූ පරාභිභූ–වෙස්සභූ තිදිවාධිභූ

## ඉච්චාදයො අභිභූ සද්දසමා.

**විශේෂ:–**

සහභූ ශබ්දයෙහි ප්‍ර. ආ. ද්වි. විභක්ති බහුවචනයන්හි සහභූ සහභුවො සහභුනො කියාවේ. ගොත්‍රභූ ශබ්දයද එසේමැයි.

---

### ඌකාරාන්ත සබ්බඤ්ඤූ ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | සබ්බඤ්ඤූ | සබ්බඤ්ඤූ, සබ්බඤ්ඤුනො |
| ආ – | (භෝ)සබ්බඤ්ඤු (භවන්තො) | සබ්බඤ්ඤූ, සබ්බඤ්ඤුනො |
| ද්වි – | සබ්බඤ්ඤුං | සබ්බඤ්ඤූ, සබ්බඤ්ඤුනො |
| තෘ – | සබ්බඤ්ඤුනා | සබ්බඤ්ඤූභි, සබ්බඤ්ඤූහි |
| කා – | සබ්බඤ්ඤුනා | සබ්බඤ්ඤූහි, සබ්බඤ්ඤූභි, |
| ච – | සබ්බඤ්ඤුනො, සබ්බඤ්ඤුස්ස | සබ්බඤ්ඤූනං |
| ප – | සබ්බඤ්ඤුනා, සබ්බඤ්ඤුම්හා, සබ්බඤ්ඤුස්මා | සබ්බඤ්ඤූභි, සබ්බඤ්ඤූහි |
| ෂ – | සබ්බඤ්ඤුනො, සබ්බඤ්ඤුස්ස | සබ්බඤ්ඤූනං |
| ස = | සබ්බඤ්ඤුම්හි, සබ්බඤ්ඤුස්මිං | සබ්බඤ්ඤූසු |

**සබ්බඤ්ඤූ ශබ්දයෙන් සම්භූෂණන් කියත්.**

එවං මග්ගඤ්ඤූ ධම්මඤ්ඤූ අත්ථඤ්ඤූ කාලඤ්ඤූ රත්තඤ්ඤූ මත්තඤ්ඤූ සාහඤ්ඤූ භත්තඤ්ඤූ වදඤ්ඤූ විඤ්ඤූ විද්දූ වේදගූ පාරගූ ආදයො.

## ඔකාරාන්ත ගො ශබ්දය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | ගො | ගාවො, ගවො |
| ආ – | (හෙ) ගො (භවන්තො) | ගාවො, ගවො |
| ද්වි – | ගාවුං, ගාවං, ගවං | ගාවො, ගවො |
| තෘ – | ගාවෙන, ගවෙන | ගොහි, ගොභි |
| ක – | ගාවෙන, ගවෙන | ගොහි, ගොභි |
| ච – | ගාවස්ස, ගවස්ස | ගවං, ගුන්නං, ගොනං |
| ප – | ගාවා, ගවා, ගාවම්හා, ගවම්හා ගාවස්මා, ගවස්මා | ගොහි, ගොභි |
| ෂ – | ගාවස්ස, ගවස්ස | ගවං, ගුන්නං, ගොනං |
| ස – | ගාවෙ, ගවෙ, ගාවම්හි, ගවම්හි ගාවස්මිං, ගවස්මිං, | ගාවෙසු, ගවෙසු, ගොසු |

**ගො ශබ්දයෙන් ගවයන් කියත්.**

---

**බුද්ධත්තා රාජ බ්‍රහ්මා ච-සඛා පුමා යුවා මනො**
**ගුණවා ගච්ඡං භවං සාගගි-ආදි දණ්ඩිම භික්ඛුපි**
**හෙතු ජන්තු ගරූ සත්ථා-පිතා ච අභිභූ තථා**
**සබ්බඤ්ඤූ හොති පුල්ලිඞ්ග-සද්දානං සඞ්ගහො භවෙ**
**අවණ්ණි'වණ්ණු'වණ්ණන්තා-ඔකාරන්තාති සත්තධා**
**ඊසා පුල්ලිඞ්ග භෙදති-විඤ්ඤෙය්‍යා විභාවිනා**

## පුල්ලිඞ්ග ශබ්ද නිමි.

---

## ස්ත්‍රී ලිඞ්ග ශබ්ද.

### ආකාරාන්ත කඤ්ඤා ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | කඤ්ඤා | කඤ්ඤා, කඤ්ඤායො |
| ආ – | (හෙ) කඤ්ඤෙ (භොති) | කඤ්ඤා, කඤ්ඤායො |
| ද්වි – | කඤ්ඤං | කඤ්ඤා, කඤ්ඤායො |
| තෘ – | කඤ්ඤාය | කඤ්ඤාහි, කඤ්ඤාභි |
| ක – | කඤ්ඤාය | කඤ්ඤාහි, කඤ්ඤාභි |
| ච – | කඤ්ඤාය | කඤ්ඤානං |
| ප – | කඤ්ඤාය | කඤ්ඤාහි, කඤ්ඤාභි |
| ෂ – | කඤ්ඤාය | කඤ්ඤානං |
| ස – | කඤ්ඤායං, කඤ්ඤාය | කඤ්ඤාසු |

**කඤ්ඤා ශබ්දයෙන් කන්‍යාවන් කියත්.**

සද්ධා මෙධා පඤ්ඤා විජ්ජා–චින්තා මන්තා තණ්හා වීණා
ඉච්ඡා මුච්ඡා එජා මායා–මෙත්තා මත්තා සික්ඛා භික්ඛා

ජංඝා ගීවා ජිව්හා වාචා–ඡායා ආසා ගඞ්ගා නාවා
ගාථා සෙනා ලෙඛා සාලා–මාලා වෙලා පූජා ඛිඩ්ඩා

පිපාසා වෙදනා සඤ්ඤා–චෙතනා තසිණා පජා
දෙවතා වට්ටකා ගොධා–බලාකා පරිසා සභා

ඌකා සෙඵාලිකා ලඞ්කා–සලාකා වාලුකා සිඛා
විසාඛා විසිඛා සාඛා–වචා වඤ්ඣා ජටා ඝටා

ජෙට්ඨා සොණ්ඩා විතණ්ඩා ච–කරුණා වනිතා ලතා
කථා නිද්දා සුධා රාධා–වාසනා සිංසපා පපා

පභා සීමා ඛමා ජායා–ඛත්තියා සක්ඛරා සුරා
දොලා තුලා සිලා ලීලා–ලාලෙ'ලා මෙඛලා කලා

වළවා' ලම්බුසා මූසා–මඤ්ජුසා සුලසා දිසා
නාසා ජුණ්හා ගුහා ඊහා–ලසිකා වසුධා පියා

අභිජ්ඣා සුණිසා බාහා–නාසා කිළා ච කාරණා
සාකච්ඡා භාවිකා සිකතා–කන්තා ලාඛා කුසා නිසා

පීළා සුණ්හා සංඛා සඞ්කා–මුද්දා භස්තා සත්තා දද්දා
අම්මා අම්බා අන්නා තාතා–එත සද්ද කඤ්ඤා සාදී

**විශෙෂ:–**

i අම්මා-අම්බා-අන්නා-තාතා යන ශබ්දයෝද් ආලපන එකවචනය හැර සෙසු සියලු තන්හි කඤ්ඤා ශබ්දය මෙන් වරනැගෙත්. එකී ශබ්ද ආලපනයෙහි

| | | | |
|---|---|---|---|
| (හෙ) | අම්ම අම්මා | (හොන්ති) | අම්මා අම්මායො |
| (හෙ) | අම්බ අම්බා | (හොන්ති) | අම්බා අම්බායො |
| (හෙ) | අන්න අන්නා | (හොන්ති) | අන්නා අන්නායො |
| (හෙ) | තාත තාතා | (හොන්ති) | තාතා තාතායො |

යනුවෙන් වරනැගෙන බැවින් ආලපන එකවචනයෙහි වෙනස්වන අයුරු දතයුතුයි.

ii **සභා පරිසා** ශබ්දයෝ ද කඤ්ඤා ශබ්දය මෙනි. එහෙත් සත්තමී එකවචනයෙහි **සභතිං පරිසතිං** යන වැඩිපුර රූපයක් ලැබීම පමණක් වෙනසි.

## ඉකාරාන්ත රත්ති ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර - | රත්ති | රත්තී, රත්තියො |
| ආ - | (හෙ රත්ති (භොති) | රත්තී, රත්තියො |
| ද්වි - | රත්තිං | රත්තී, රත්තියො |
| තෘ - | රත්තියා | රත්තීහි, රත්තීභි |
| ක - | රත්තියා | රත්තීහි, රත්තීභි |
| ච - | රත්තියා | රත්තීනං |
| ප - | රත්තියා | රත්තීහි, රත්තීභි |
| ෂ - | රත්තියා | රත්තීනං |
| ස - | රත්තියං, රත්තියා | රත්තීසු |

### රත්ති ශබ්දයෙන් රූපසිද්ධිය කියන්.

පත්ති යුත්ති වුත්ති කිත්ති - මුත්ති තිත්ති ඛන්ති කන්ති
සන්ති තන්ති සිද්ධි සුද්ධි - ඉද්ධි වුද්ධි බුද්ධි බොධි

භූමි ජාති පීති සුති - නන්දි සන්ධි සාණී කොටි
දිට්ඨි වුට්ඨි තුට්ඨි යට්ඨි - පාළි ආළි නාළි කෙළි

සති මති ගති චුති ධිති රති රුචි ඡවි සාති යුවති රස්මි අසනි
වසනි ඔසධි අඞ්ගුලි ධූලි දුන්දුභි දොණි අටවි පාටලි සිරි ථුති ආකති

### ඉච්චාදයො රත්ති සද්ද සමා

**විශෙෂ:—**

i රත්ති ශබ්දයේ ප්‍ර-ආ-ද්වි-විභක්ති බහුවචනයන්හි **රත්‍යො** යන රූප යක්ද තෘ-ක-ච-ප-ෂ-ස-විභක්ති එකවචනයන්හි **රත්‍යා** යන රූපයක්ද සප්තමි එකවචනයෙහි **රත්‍යං-රත්තං-රත්තො** යන රූපද කිසි තැනෙක්හි යෙදේ. (එය බහුල ව්‍යවහාරයක් නොවන බැවින් මෙහි ඇතුළත් නොකරන ලදි. මෙහි දැක්වූයේ රත්ති ශබ්දය පිළිබඳ සාමාන්‍ය වරනැගීම් ක්‍රමයයි.) රත්තො යන්න හැර පත්ති ඛන්ති මති භූමි නාභි ආදී සෙසු ශබ්දයන්හිද මෙබඳු විශෙෂ රූප ලැබේ.

ii බොධි ශබ්දයේ ප්‍ර-ආ-ද්වි බහුවචනයන්හි **බොජ්ඣා** යනුද තෘ-ක-ච-ප-ෂ-ස එකවචනයන්හි **බොජ්ඣා** යනුද සප්තමි එකවචනයෙහි **බොජ්ඣං** යනුද ද්විතීයා එකවචනයෙහි **බොධියං** යනුද ලැබේ.

## ඊකාරාන්ත නදී ශබ්දය

| | එකවචන | | බහුවචන |
|---|---|---|---|
| ප්‍ර – | නදී | | නදී, නජ්ජෝ, නදියෝ |
| ආ – | (හෙ) නදි | (භොති) | නදී, නජ්ජෝ, නදියෝ |
| ද්වි – | නදියං, නදිං | | නදී, නජ්ජෝ, නදියෝ |
| තෘ – | නජ්ජා, නදියා | | නදීහි, නදීභි |
| ක – | නජ්ජා, නදියා | | නදීහි, නදීභි |
| ච – | නජ්ජා, නදියා | | නදීනං |
| ප – | නජ්ජා, නදියා | | නදීහි, නදීභි |
| ෂ – | නජ්ජා, නදියා | | නදීනං |
| ස – | නජ්ජං, නදියං, නදියා | | නදීසු |

**නදී ශබ්දයෙන් ගංගා කියත්.**

---

## ඊකාරාන්ත ඉත්ථී ශබ්දය

| | | | |
|---|---|---|---|
| ප්‍ර – | ඉත්ථී | | ඉත්ථී, ඉත්ථියෝ |
| ආ – | (හෙ) ඉත්ථි | (භොති) | ඉත්ථී, ඉත්ථියෝ |
| ද්වි – | ඉත්ථියං, ඉත්ථිං | | ඉත්ථී, ඉත්ථියෝ |
| තෘ – | ඉත්ථියා | | ඉත්ථීහි, ඉත්ථීභි |
| ක – | ඉත්ථියා | | ඉත්ථීහි, ඉත්ථීභි |
| ච – | ඉත්ථියා | | ඉත්ථීනං |
| ප – | ඉත්ථියා | | ඉත්ථීහි, ඉත්ථීභි |
| ෂ – | ඉත්ථියා | | ඉත්ථීනං |
| ස – | ඉත්ථියං, ඉත්ථියා | | ඉත්ථීසු |

**ඉත්ථී ශබ්දයෙන් ස්ත්‍රීන් කියත්.**

මහී වේතරණී වාපී-පාටලී කදලී ඝටී
නාරී කුමාරී තරුණී-වාරුණී බ්‍රාහ්මණී සඛී
ගන්ධබ්බී කින්නරී නාගී-දේවී යක්ඛී අජී මිගී
වානරී සූකරී සීහී-හංසී කාකී ච කුක්කුටී

මාතුලානී අය්‍යකානී ඛත්තියානී වරුණානී මානවී නාවිකී වේනතෙය්‍යී ගෝතමී ගුණවතී ගුණවන්තී කුලවතී කුලවන්තී සතිමතී සතිමන්තී මහතී මහන්තී සතී ආලී භොතී භික්ඛුනී

රජිනී දණ්ඩිනී ගහපතානී හත්ථිනී මෙධාවිනී තාපසිනී පියභාණිනී පොක්ඛරණී පරචිත්තවිදුනී ගාවී පුථවී

## ඉච්චාදයො ඉත්ථී සද්ද සමා.

---

**විශෙෂ:—**

i පොක්ඛරණී ශබ්දයේ ප්‍රථමා ආලපන ද්විතීයා බහුවචනයන්හි **පොක්ඛරඤ්ඤො**, යනුද ද්විතීයා එකවචනයෙහි **පොක්ඛරඤ්ඤං** යනුද තෘතීයාදි එකවචනයන්හි **පොක්ඛරඤ්ඤා**, කියාද, සප්තමී එකවචනයෙහි **පොක්ඛරඤ්ඤා**, **පොක්ඛරඤ්ඤං** කියාද වැඩිපුර යෙදේ.

සෙස්ස ඉත්ථී ශබ්දය මෙනි.

ii පුථවි ශබ්දයේ තෘ-කා-ච-ප-ෂ-ස-විභක්ති එකවචනයන්හි පුථව්‍යා-පුථවියා යනුද, සප්තමී එකවචනයෙහි පුථව්‍යං-පුථවියං-පුථවියා යනුද වෙනසි.

iii දසී බ්‍රාහ්මණී ශබ්දයන්හිද දස්‍යො, බ්‍රාහ්මණ්‍යො, දස්‍යා, බ්‍රාහ්මණ්‍යා යනාදි එබඳු විශෙෂ රූප යෙදේ.

---

### උකාරාන්ත යාගු ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | යාගු | යාගූ, යාගුයො |
| ආ – | (භෙ) යාගු | (භොන්ති) යාගූ, යාගුයො |
| ද්වි – | යාගුං | යාගූ, යාගුයො |
| තෘ – | යාගුයා | යාගූහි, යාගූභි |
| කා – | යාගුයා | යාගූහි, යාගූභි |
| ච – | යාගුයා | යාගූනං |
| ප – | යාගුයා | යාගූහි, යාගූභි |
| ෂ – | යාගුයා | යාගූනං |
| ස – | යාගුයං, යාගුයා | යාගූසු |

### යාගු ශබ්දයෙන් ගුළුකැන් කිහත්.

එවං ධාතු ධේනු කාසු දද්දු කණ්ඩු කච්ඡු රජ්ජු කණෙරු පියඞ්ගු සස්සු ආදයො යාගු සදිසාව.

---

## උකාරාන්ත මාතු ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | මාතා | මාතරො |
| ආ – | (හෙ)මාත, මාතා | (භොතී) මාතරො |
| ද්වි – | මාතරං | මාතරෙ, මාතරො |
| තෘ – | මාතරා, මාතුයා | මාතරෙහි, මාතරෙභි<br>මාතූහි, මාතූභි |
| ක – | මාතරා, මාතුයා | මාතරෙහි, මාතරෙභි<br>මාතූහි, මාතූභි |
| ච – | මාතු, මාතුයා | මාතරානං, මාතානං, මාතූනං |
| ප – | මාතරා, මාතුයා | මාතරෙහි, මාතරෙභි<br>මාතූහි, මාතූභි |
| ෂ – | මාතු, මාතුයා | මාතරානං, මාතානං, මාතූනං |
| ස – | මාතරි, මාතුයං, මාතුයා | මාතරෙසු, මාතූසු |

**මාතු ශබ්දයෙන් මවුන් කියත්**

එවං ධීතු දුහිතු ආදයො.

**විශෙෂ:-**

මාතු ශබ්දයේ ප්‍ර-ආ-විභක්ති බහුවචනයන්හි **මාතා** යනුද තෘ-කා-ච-ප-ෂ-ස-එකවචනයන්හි **මත්‍යා** යනුද ච-ෂ-එක වචනයන්හි මාතුස්ස යනුද ලැබේ නමුත් ධීතු දුහිතු ශබ්දයන්හි එබඳු රූප නොලැබේ.

---

## ඌකාරාන්ත ජම්බු ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | ජම්බූ | ජම්බූ, ජම්බුයො |
| ආ – | (හෙ)ජම්බු | (භොතී) ජම්බූ, ජම්බුයො |
| ද්වි – | ජම්බුං | ජම්බූ, ජම්බුයො |
| තෘ – | ජම්බුයා | ජම්බූහි, ජම්බූභි |
| ක – | ජම්බුයා | ජම්බූහි, ජම්බූභි |
| ච – | ජම්බුයා | ජම්බූනං |
| ප – | ජම්බුයා | ජම්බූහි, ජම්බූභි |
| ෂ – | ජම්බුයා | ජම්බූනං |
| ස – | ජම්බුයං, ජම්බුයා | ජම්බූසු |

**ජම්බු ශබ්දයෙන් දඹ කියත්.**

එවං වධූ ච සරභූ-සරබූ සුතනූ චමූ
වාමොරූ නාගනාසූරූ-සමානි බලූ ජම්බූයා

---

## ඔකාරාන්ත ගො ශබ්දය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | ගො | ගාවො, ගවො |
| ආ – | (හෙ) ගො | (භොතී) ගාවො, ගවො |
| දු – | ගාවුං, ගාවං, ගවං | ගාවො, ගවො |
| තෘ – | ගාවෙන, ගවෙන | ගොහි, ගොභි |
| කා – | ගාවෙන, ගවෙන | ගොහි, ගොභි |
| ච – | ගාවස්ස, ගවස්ස | ගවං, ගුන්නං, ගොනං |
| ප – | ගාවා, ගවා, ගාවම්හා, ගවම්හා ගාවස්මා, ගවස්මා | ගොහි, ගොභි |
| ෂ – | ගාවස්ස, ගවස්ස | ගවං, ගුන්නං, ගොනං |
| ස – | ගාවෙ, ගවෙ, ගාවම්හි, ගවම්හි ගාවස්මිං, ගවස්මිං | ගාවෙසු, ගවෙසු, ගොසු |

### ගො ශබ්දයෙන් දෙනුන් කියත්

**කාසඤ්ඤ, රත්ති නදී ඉත්ථි-ශාගු මාතා'ච ජම්බුසි**
**ගො'ති'ත්ථිලිඞ්ග සඤ්ඤාතං-සංගහො ඉධ දස්සිතො**

**ආකාරි'වණ්ණු 'වණ්ණන්තා-ඔකාරයොනා'ති ඉත්ථියං**
**ජධා හොන්තීති විඤ්ඤූහි-අනන්තභෙදෙ විජානියො**

## ස්ත්‍රී ලිඞ්ග ශබ්ද නිමි.

---

## නපුංසක ලිඞ්ග ශබ්ද

### අකාරාන්ත චිත්ත ශබ්දය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | චිත්ත | චිත්තා, චිත්තානි |
| ආ – | (හෙ) චිත්ත, චිත්තා | (භවන්තානි) චිත්තා, චිත්තානි |
| දු – | චිත්තං | චිත්තෙ, චිත්තානි |
| තෘ – | චිත්තෙන | චිත්තෙහි, චිත්තෙභි |
| කා – | චිත්තෙන | චිත්තෙහි, චිත්තෙභි |

| | | |
|---|---|---|
| ච – | චිත්තාය, චිත්තස්ස | චිත්තානං |
| ප – | චිත්තා, චිත්තම්හා චිත්තස්මා | චිත්තෙහි, චිත්තෙභි |
| ඡ – | චිත්තස්ස | චිත්තානං |
| ස – | චිත්තෙ, චිත්තම්හි, චිත්තස්මිං | චිත්තෙසු |

### චිත්ත ශබ්දයෙන් සිත කියත්

පුඤ්ඤ පාප ඵල රූප සාධනං–සොත ඝාණ සුඛ දුක්ඛ කාරණං
දාන සීල ධන ඣාන ලොචනං–මූල කූල බල ජාල මඞ්ගලං

නලින ලිඞ්ග මුඛ'ඞ්ග ජලම්බුජං–පුලින ධඤ්ඤ හිරඤ්ඤ පද'මතං
පදුම පණ්ණ සුසාන වනා'යුධං–හදය චීවර වත්ථ කුලි'න්ද්‍රියං

නයන වදන යානො'දන සොපාණ පානං
භවන භුවන ලොහා'ලාත තුණ්ඩ'ණ්ඩ පීඨං
කරණ මරණ ඤාණා' රම්මණා'රඤ්ඤ තානං
තගර නගර තිරච්ඡත්ත ඡිද්දො'දකානි

## ඉච්චාදයො චිත්ත සද්ද සමා

---

### අකාරාන්ත මන ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | මනං | මනා, මනානි |
| ආ – | (හෙ) මන, මනා (භවන්තානි) | මනා, මනානි |
| ද්වි – | මනං, | මනෙ, මනානි |
| තෘ – | මනසා, මනෙන | මනෙහි, මනෙභි |
| කා – | මනසා, මනෙන | මනෙහි, මනෙභි |
| ච – | මනසො, මනස්ස | මනානං |
| ප – | මනසා, මනා, මනම්හා, මනස්මා | මනෙහි, මනෙභි |
| ඡ – | මනසො, මනස්ස | මනානං |
| ස – | මනසි, මනෙ, මනම්හි, මනස්මිං | මනෙසු |

### මන ශබ්දයෙන් සිත කියත්

එවං තමං තපං තෙජං–වචං ඔජං උරං සිරං
රජං යසං පයං චෙතං–සරං වාසං වයං අයං

---

## අකාරාන්ත කම්ම ශබ්දය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | කම්මං | කම්මා, කම්මානි |
| ආ – | (හෙ) කම්ම, කම්මා (භවන්තානි) | කම්මා, කම්මානි |
| ද්වි – | කම්මං | කම්මෙ, කම්මානි |
| තෘ – | කම්මෙන, කම්මුනා, කම්මනා | කම්මෙහි, කම්මෙභි |
| කා – | කම්මෙන, කම්මුනා, කම්මනා | කම්මෙහි, කම්මෙභි |
| ච – | කම්මුනො, කම්මස්ස | කම්මානං |
| ප – | කම්මුනා, කම්මා, කම්මම්හා, කම්මස්මා | කම්මෙහි, කම්මෙභි |
| ෂ – | කම්මුනො, කම්මස්ස | කම්මානං |
| ස – | කම්මනි, කම්මෙ, කම්මම්හි, කම්මස්මිං | කම්මෙසු |

**කම්ම ශබ්දයෙන් කාර්ය කියත්**

---

## අකාරාන්ත චම්ම ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | චම්මං | චම්මා, චම්මානි |
| ආ – | (හෙ) චම්ම, චම්මා, (භවන්තානි) | චම්මා, චම්මානි |
| ද්වි – | චම්මං | චම්මෙ, චම්මානි |
| තෘ – | චම්මෙන, චම්මිනා | චම්මෙහි, චම්මෙභි |
| කා – | චම්මෙන, චම්මිනා | චම්මෙහි, චම්මෙභි |
| ච – | චම්මස්ස | චම්මානං |
| ප – | චම්මා, චම්මම්හා, චම්මස්මා | චම්මෙහි, චම්මෙභි |
| ෂ – | චම්මස්ස | චම්මානං |
| ස – | චම්මනි, චම්මෙ, චම්මම්හි, චම්මස්මිං | චම්මෙසු |

**චම්ම ශබ්දයෙන් සම් කියත්**

එවං වෙසම භසමාදයො

---

## අකාරාන්ත ගුණවන්තු ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | ගුණවං | ගුණවන්තා, ගුණවන්තානි |
| ආ – | (හෙ) ගුණවං, ගුණව, ගුණවා | (භවන්තානි) ගුණවන්තා, ගුණවන්තානි |

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ද්වි – | ගුණවන්තං | ගුණවන්තෙ, ගුණවන්තානි |
| තෘ – | ගුණවතා, ගුණවන්තෙන, | ගුණවන්තෙහි, ගුණවන්තෙභි |

සෙස්ස පුල්ලිඞ්ගයෙහි මෙනි.

**ගුණවන්තු ශබ්දයෙන් ගුණවත් නපුංසක වාච්‍යයෙන් කියත්**

**විශෙෂ:–**

ප්‍රථමා-ආලපන-ද්විතීයා බහුවචනයන්හි ගුණවන්ති යන රූපයක්ද කිසි තැනෙක ලැබේ.

---

## අකාරාන්ත ගච්ඡන්ත ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | ගච්ඡං | ගච්ඡන්තා, ගච්ඡන්තානි |
| ආ – | (හෙ) ගච්ඡං, ගච්ඡ, ගච්ඡා | (භවන්තානි) ගච්ඡන්තා, ගච්ඡන්තානි |
| ද්වි – | ගච්ඡන්තං | ගච්ඡන්තෙ, ගච්ඡන්තානි |
| තෘ – | ගච්ඡතා, ගච්ඡන්තෙන | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි |

සෙස්ස පුල්ලිඞ්ගයෙහි මෙනි

**ගච්ඡන්ත ශබ්දයෙන් යන්නාවූ නපුංසක වාච්‍යයෙන් කියත්.**

---

## ආකාරාන්ත අස්සද්ධා ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | අස්සද්ධං | අස්සද්ධා, අස්සද්ධානි |
| ආ – | (හෙ) අස්සද්ධ, අස්සද්ධා | (භවන්තානි) අස්සද්ධා, අස්සද්ධානි |
| ද්වි – | අස්සද්ධං | අස්සද්ධෙ, අස්සද්ධානි |
| තෘ – | අස්සද්ධෙන | අස්සද්ධෙහි, අස්සද්ධෙභි |
| කා – | අස්සද්ධෙන | අස්සද්ධෙහි, අස්සද්ධෙභි |
| ච – | අස්සද්ධාය, අස්සද්ධස්ස | අස්සද්ධානං |
| ප – | අස්සද්ධා, අස්සද්ධම්හා, අස්සද්ධස්මා | අස්සද්ධෙහි, අස්සද්ධෙභි |
| ෂ – | අස්සද්ධස්ස | අස්සද්ධානං |
| ස – | අස්සද්ධෙ, අස්සද්ධම්හි, අස්සද්ධස්මිං | අස්සද්ධෙසු |

**අස්සද්ධා ශබ්දයෙන් සැදැහැනැති කුලයන් කියත්.**

## ආකාරාන්ත මුඛනාසික ශබ්දය

(ඒකවචනයෙහි පමණක් වරනැගේ)

| | |
|---|---|
| ප්‍ර – | මුඛනාසිකං |
| ආ – | (හෙ) මුඛනාසික, මුඛනාසිකා |
| ද්වි – | මුඛනාසිකං |
| තෘ – | මුඛනාසිකෙන |
| කා – | මුඛනාසිකෙන |
| ච – | මුඛනාසිකාය, මුඛනාසිකස්ස |
| ප – | මුඛනාසිකා, මුඛනාසිකම්හා, මුඛනාසිකස්මා |
| ෂ – | මුඛනාසිකස්ස |
| ස – | මුඛනාසිකෙ, මුඛනාසිකම්හි, මුඛනාසිකස්මිං |

**මුඛනාසික ශබ්දයෙන් මුඛය හා නාසිකාව කියත්**

---

## ඉකාරාන්ත අක්ඛි ශබ්දය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | අක්ඛි | අක්ඛී, අක්ඛීනි |
| ආ – | (හෙ) අක්ඛි | (භවන්තානි) අක්ඛී, අක්ඛීනි |
| ද්වි – | අක්ඛිං | අක්ඛී, අක්ඛීනි |
| තෘ – | අක්ඛිනා | අක්ඛීහි, අක්ඛීභි |
| කා – | අක්ඛිනා | අක්ඛීහි, අක්ඛීභි |
| ච – | අක්ඛිනො, අක්ඛිස්ස | අක්ඛීනං |
| ප – | අක්ඛිනා, අක්ඛිම්හා, අක්ඛිස්මා | අක්ඛීහි, අක්ඛීභි |
| ෂ – | අක්ඛිනො, අක්ඛිස්ස | අක්ඛීනං |
| ස – | අක්ඛිම්හි, අක්ඛිස්මිං | අක්ඛීසු |

**අක්ඛි ශබ්දයෙන් ඇස කියත්**

එවං සත්ථි දධි වාරි අට්ඨි අච්ඡි අච්චි ඉච්චාදයො.

---

## ඊකාරාන්ත දණ්ඩී ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | දණ්ඩි | දණ්ඩී, දණ්ඩීනි |
| ආ – | (හෙ) දණ්ඩි | (භවන්තානි) දණ්ඩී, දණ්ඩීනි |
| ද්වි – | දණ්ඩිනං, දණ්ඩිං | දණ්ඩී, දණ්ඩීනි |
| තෘ – | දණ්ඩිනා | දණ්ඩීහි, දණ්ඩීභි |

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ක – | දණ්ඩිනා | දණ්ඩීහි, දණ්ඩීභි |
| ච – | දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| ප – | දණ්ඩිනා, දණ්ඩිම්හා, දණ්ඩිස්මා | දණ්ඩීහි, දණ්ඩීභි |
| ඡ – | දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| ස – | දණ්ඩිනි, දණ්ඩිම්හි, දණ්ඩිස්මිං | දණ්ඩීසු, දණ්ඩීසු |

**දණ්ඩි ශබ්දයෙන් දඬුගත් නපුංසක වාච්‍යයෙන් කියත්.**

එවං ඤාණී සුඛකාරී සීඝයායී ඉච්චාදයො.

---

### උකාරාන්ත ආයු ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | ආයු | ආයූ, ආයූනි |
| ආ – | (හෙ) ආයු (භවන්තානි) | ආයූ, ආයූනි |
| ද්වි – | ආයුං | ආයූ, ආයූනි |
| තෘ – | ආයුනා | ආයූහි, ආයූභි |
| ක – | ආයුනා | ආයූහි, ආයූභි |
| ච – | ආයුනො, ආයුස්ස | ආයූනං |
| ප – | ආයුනා, ආයුම්හා, ආයුස්මා | ආයූහි, ආයූභි |
| ඡ – | ආයුනො, ආයුස්ස | ආයූනං |
| ස – | ආයුම්හි, ආයුස්මිං | ආයූසු, ආයූසු, |

**ආයු ශබ්දයෙන් ආයුෂ කියත්**

එවං චක්ඛු වසු ධනු දාරු තිපු මධු සිඟු භිඞ්ගු වත්ථු මත්ථු ජතු අම්බු අස්සු ආදයො ආයු සද්ද සමා.

**විශෙෂ:–**

1 ආයු ශබ්දයේ තෘතීයා කරණ එකවචනයෙහි ආයුසා යන්නක්ද ලැබේ එබඳු රූපයක් සෙසු චක්ඛු ආදි ශබ්දයන්හි නොයෙදේ.

ii අම්බු ශබ්දයේ සප්තමී එකවචනයෙහි **අම්බුනි** යන විශෙෂ රූපයක්ද ලැබේ.

---

### ඌකාරාන්ත ගොත්‍රභූ ශබ්දය

| | | |
|---|---|---|
| ප්‍ර – | ගොත්‍රභු | ගොත්‍රභූ ගොත්‍රභූනි |
| ආ – | (හෙ) ගොත්‍රභු (භවන්තානි) | ගොත්‍රභූ, ගොත්‍රභූනි |

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ද්වි – | ගොත්‍රභුං | ගොත්‍රභූ, ගොත්‍රභුනි |
| තෘ – | ගොත්‍රභුනා | ගොත්‍රභූහි, ගොත්‍රභූභි |

සෙස්ස අභිභූ ශබ්දය මෙනි

**ගොත්‍රභූ ශබ්දයෙන් ඊනම් සිත කියත්**

---

**ඔකාරාන්ත චිත්තගො ශබ්දය**

| | | |
|---|---|---|
| ප්‍ර – | චිත්තගු | චිත්තගූ, චිත්තගූනි |
| ආ –(හෙ)චිත්තගු | (භවන්තානි) | චිත්තගූ, චිත්තගූනි |
| ද්වි – | චිත්තගුං | චිත්තගූ, චිත්තගූනි |
| තෘ– | චිත්තගුනා | චිත්තගූහි, චිත්තගූභි |

සෙස්ස ආයු ශබ්දය මෙනි

**චිත්තගො ශබ්දයෙන් විසිතුරු ගවයන් ඇති කැලය කියත්**

---

**චිත්තං මනං කම්ම වම්මා–ගුණවං ගච්ඡං තථෙවච**
**අස්සඩං මුඛනාසිකං ච–අඨි දණ්ඩායු ගොත්‍රභූ**
**චිත්තගූති ඉමෙ සද්දා–දස්සිතා'ත්‍ර නපුංසකෙ**
**අවණ්ණි' වණ්ණු' වණ්ණන්තා–ඔකාරන්තොති සත්තධා**
**නපුංසකස්ස'න්ත භෙදා–විඤ්ඤාතබ්බා සරූපතො**

## නපුංසක ලිඞ්ග ශබ්ද නිමි.

---

## සර්වනාම ශබ්ද

**සබ්බ කතර කතම උභය ඉතර අඤ්ඤ අඤ්ඤතර අඤ්ඤතම පුබ්බ පර අපර දක්ඛිණ උත්තර අධර ය ත එත ඉම අමු කිං ඒක තුම්හ අම්හ උභ ද්වි ති චතු ඉති සත්ත වීසති සබ්බනාමානි.**

# සබ්බ ශබ්දය

## පුල්ලිඞ්ගය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | සබ්බො | සබ්බෙ |
| ආ – | (හෙ) සබ්බ, සබ්බා (භවන්තො) | සබ්බෙ |
| ද්වි – | සබ්බං | සබ්බෙ |
| තෘ – | සබ්බෙන | සබ්බෙභි, සබ්බෙහි |
| කා – | සබ්බෙන | සබ්බෙභි, සබ්බෙහි |
| ච – | සබ්බස්ස | සබ්බෙසං, සබ්බෙසානං |
| ප – | සබ්බම්හා, සබ්බස්මා | සබ්බෙභි, සබ්බෙහි |
| ෂ – | සබ්බස්ස | සබ්බෙසං, සබ්බෙසානං |
| ස – | සබ්බම්හි, සබ්බස්මිං | සබ්බෙසු |

## ස්ත්‍රීලිඞ්ගය

| | | |
|---|---|---|
| ප්‍ර – | සබ්බා | සබ්බා, සබ්බායො |
| ආ – | (හෙ) සබ්බෙ (භොන්ති) | සබ්බා, සබ්බායො |
| ද්වි – | සබ්බං | සබ්බා, සබ්බායො |
| තෘ – | සබ්බාය | සබ්බාභි, සබ්බාහි |
| කා – | සබ්බාය | සබ්බාභි, සබ්බාහි |
| ච – | සබ්බස්සා, සබ්බාය | සබ්බාසං, සබ්බාසානං |
| ප – | සබ්බාය | සබ්බාභි, සබ්බාහි |
| ෂ – | සබ්බස්සා, සබ්බාය | සබ්බාසං, සබ්බාසානං |
| ස – | සබ්බස්සං, සබ්බායං | සබ්බාසු |

## නපුංසක ලිඞ්ගය

| | | |
|---|---|---|
| ප්‍ර – | සබ්බං | සබ්බානි |
| ආ – | (හෙ) සබ්බ, සබ්බා (භවන්තානි) | සබ්බානි |
| ද්වි – | සබ්බං | සබ්බානි |
| තෘ – | සබ්බෙන | සබ්බෙභි, සබ්බෙහි |

සෙස්ස පුල්ලිඞ්ගයෙහි මෙනි

**සබ්බශබ්දයෙන් සියල්ල යන අර්ථය කියත්.**

කතර කතම උභය ඉතර අඤ්ඤ අඤ්ඤතර අඤ්ඤතම ශබ් යෝද සබ්බ ශබ්දයා හා සමානයි.

**විශේෂ:-**

i ස්ත්‍රීලිඞ්ගයෙහිවූ ඉතර-අඤ්ඤ ශබ්දයන්ගේ චතුර්ථී-ෂෂ්ඨී-සප් ඒකවචනයන්හි

ච-ෂ- ඉතරිස්සාය-ඉතරිස්සා-ඉතරාය
ස- ඉතරිස්සං-ඉතරායං-ඉතරාය
ච-ෂ- අඤ්ඤිස්සාය-අඤ්ඤිස්සා-අඤ්ඤාය
ස- අඤ්ඤිස්සං-අඤ්ඤායං-අඤ්ඤාය

යනුවෙන් වරනැඟේ. සෙස්ස සබ්බ ශබ්දය මෙනි.

ii ද්වන්ද්ව සමාසයෙහි සමාසවූ කතරාදි ශබ්දයන්ගේ ප්‍රථමා බහුවචනයෙ ආකාරාදේශ රූපද ලැබේ.

**කතරකතමෙ-කතරකතමා යනුවෙනි.**

iii මේ සබ්බ ආදි ශබ්දයන්ගේ පුං නපුංසක දෙක්හි චතුර්ථී පඤ්ච සප්තමී ඒකවචනයන්හි ආය-ආ-ඒ ආදේශවත් රූපයෝ නොලැබෙත්. එනම්: සබ්බාය-සබ්බා-සබ්බෙ යන මොහුයි.

---

## පුබ්බ ශබ්දය

### පුල්ලිඞ්ග

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | පුබ්බො | පුබ්බෙ, පුබ්බා |
| ආ – | (හෙ) පුබ්බ, පුබ්බා | (භවන්තො) පුබ්බෙ, පුබ්බා |
| ද්වි – | පුබ්බං | පුබ්බෙ |
| තෘ – | පුබ්බෙන | පුබ්බෙහි, පුබ්බෙභි |
| ක – | පුබ්බෙන | පුබ්බෙහි, පුබ්බෙභි |
| ච – | පුබ්බස්ස | පුබ්බෙසං, පුබ්බෙසානං |
| ප – | පුබ්බා, පුබ්බම්හා, පුබ්බස්මා | පුබ්බෙහි, පුබ්බෙභි |
| ෂ – | පුබ්බස්ස | පුබ්බෙසං, පුබ්බෙසානං |
| ස – | පුබ්බෙ, පුබ්බම්හි, පුබ්බස්මිං | පුබ්බෙසු |

---

## ස්ත්‍රීලිඞ්ගය

| | ඒකවචන | | බහුවචන |
|---|---|---|---|
| ප්‍ර – | පුබ්බා | | පුබ්බා, පුබ්බායො |
| ආ – | (හෙ) පුබ්බෙ | (හොති) | පුබ්බා පුබ්බායො |
| ද්වි – | පුබ්බං | | පුබ්බා, පුබ්බායො |
| තෘ – | පුබ්බාය | | පුබ්බාහි, පුබ්බාභි |
| ක – | පුබ්බාය | | පුබ්බාහි, පුබ්බාභි |
| ච – | පුබ්බස්සා, පුබ්බාය | | පුබ්බාසං, පුබ්බාසානං |
| ප – | පුබ්බාය | | පුබ්බාහි, පුබ්බාභි |
| ෂ – | පුබ්බස්සා, පුබ්බාය | | පුබ්බාසං, පුබ්බාසානං |
| ස – | පුබ්බස්සං, පුබ්බායං | | පුබ්බාසු |

---

## නපුංසක ලිඞ්ගය

| | | | |
|---|---|---|---|
| ප්‍ර – | පුබ්බං | | පුබ්බානි |
| ආ – | (හෙ) පුබ්බ, පුබ්බා | (භවන්තානි) | පුබ්බානි |
| ද්වි – | පුබ්බං | | පුබ්බානි |
| තෘ – | පුබ්බෙන | | පුබ්බෙහි, පුබ්බෙභි |

සෙස්ස පුල්ලිඞ්ගයෙහි මෙනි.

**පුබ්බ ශබ්දයෙන් සදිස කියත්.**

පර අපර දක්ඛිණ උත්තර අධර ශබ්දයෝද පුබ්බ ශබ්දයා මෙනි.

---

**විශෙෂ:—**

i මේ පුබ්බ අපරාදි ශබ්ද ද්වන්ද්ව සමාසයෙන් සමාසවූ කල්හි ප්‍රථමා බහුවචනයෙහි එකාරාදෙශය හැර සෙසු සර්වනාම කාර්යයක් නොවේ. ශුද්ධ නාමයක් මෙන් වරනැඟෙයි. එහෙයින් චතුර්ථී ෂෂ්ඨී බහුවචනයන්හි පුබ්බාපරෙසං-පුබ්බාපරෙසානං යනු සිද්ධ නොවේ. පුබ්බාපරානං – පුබ්බුත්තරානං – අධරුත්තරානං– දක්ඛිණුත්තරානං යනාදි වශයෙන් ශුද්ධ නාමයන්ගේ මෙනි.

ii බහුව්‍රීහි සමාසයෙහිවූ පුබ්බාදි ශබ්දද සර්වනාම මෙන් නොව ශුද්ධ නාම මෙන් වරනැඟෙයි. දිස පුබ්බ-මාසපුබ්බ-පිය පුබ්බ යනාදියයි.

දිශාවාචී බහුව්‍රීහි සමාසයෙහිවූ ශබ්ද වනාහි සර්වනාම විධානයෙන් වරනැගේ. දක්ඛිණපුබ්බා ශබ්දය සප්තමී එකවචනයෙහි දක්ඛිණපුබ්බස්සං-දක්ඛිණපුබ්බස්සා යනාදිය මෙනි.

---

## ය ශබ්දය

(ය ත එත ආදි ශබ්දයන්ගේ ආලපනයක් නැත)

### පුල්ලිඞ්ග

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | යො | යෙ |
| ද්වි – | යං | යෙ |
| තෘ – | යෙන | යෙභි, යෙහි |
| කා – | යෙන | යෙභි, යෙහි |
| ච – | යස්ස | යෙසං, යෙසානං |
| ප – | යම්හා, යස්මා | යෙභි, යෙහි |
| ෂ – | යස්ස | යෙසං, යෙසානං |
| ස – | යම්හි, යස්මිං | යෙසු |

---

### ඉත්ථිලිඞ්ග

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | යා | යා, යායො. |
| ද්වි – | යං | යා, යායො |
| තෘ – | යාය | යාභි, යාහි |
| කා – | යාය | යාභි, යාහි |
| ච – | යස්සා, යාය | යාසං, යාසානං |
| ප – | යාය | යාභි, යාහි |
| ෂ – | යස්සා, යාය | යාසං, යාසානං |
| ස – | යස්සං, යායං | යාසු |

---

### නපුංසක ලිඞ්ග

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | යං | යානි |
| ද්වි – | යං | යානි |
| තෘ – | යෙන | යෙභි, යෙහි |

සෙස්ස පුල්ලිඞ්ගයෙහි මෙනි.

**ය ශබ්දයෙන් යමෙක් යන අර්ථය කියත්.**

# ත ශබ්දය

## පුල්ලිඞ්ගය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | සො | නෙ, තෙ |
| ද්වි – | නං, තං | නෙ, තෙ |
| තෘ – | නෙන, තෙන | නෙහි, තෙහි, නෙභි, තෙභි |
| ක – | නෙන, තෙන | නෙහි, තෙහි, නෙභි, තෙභි |
| ච – | නස්ස, තස්ස, අස්ස | නෙසං, නෙසානං<br>තෙසං, තෙසානං |
| ප – | නම්හා, තම්හා, නස්මා<br>තස්මා, අස්මා | නෙහි, තෙහි, නෙභි, තෙභි |
| ෂ – | නස්ස, තස්ස, අස්ස | නෙසං, නෙසානං<br>තෙසං, තෙසානං |
| ස – | නම්හි, තම්හි, නස්මිං,<br>තස්මිං, අස්මිං | නෙසු, තෙසු |

## ස්ත්‍රීලිඞ්ගය

| | | |
|---|---|---|
| ප්‍ර – | සා | නා, නායො, තා, තායො |
| ද්වි – | නං, තං | නා, නායො, තා, තායො |
| තෘ – | නාය, තාය | නාහි, තාහි, නාභි, තාභි |
| ක – | නාය, තාය | නාහි, තාහි, නාභි, තාභි |
| ච – | නස්සාය, නස්සා, තස්සාය,<br>තස්සා, තිස්සාය, තිස්සා,<br>අස්සාය, අස්සා, නාය, තාය | ආසං, තාසං, තාසානං |
| ප – | නාය, තාය | නාහි, තාහි, නාභි, තාභි |
| ෂ – | නස්සාය, නස්සා, තස්සාය,<br>තස්සා, තිස්සාය, තිස්සා,<br>අස්සාය, අස්සා, නාය, තාය | ආසං, තාසං, තාසානං |
| ස – | තිස්සං, තස්සං, අස්සං,<br>නස්සං, නායං, තායං | නාසු, තාසු |

## නපුංසක ලිඞ්ගය

| | | |
|---|---|---|
| ප්‍ර – | නං, තං | නානි, තානි |
| ද්වි – | නං, තං | නානි, තානි |
| තෘ – | නෙන, තෙන | නෙහි, තෙහි, නෙභි, තෙභි |

සෙස්ස පුල්ලිඞ්ගයෙහි මෙනි

**ත ශබ්දයෙන් ඒ යන අර්ථය කියත්**

# එත ශබ්දය

## පුල්ලිඞ්ගය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | එසො | එතෙ |
| ද්වි – | එතං | එතෙ |
| තෘ – | එතෙන | එතෙහි, එතෙභි |
| කා – | එතෙන | එතෙහි, එතෙභි |
| ච – | එතස්ස | එතෙසං, එතෙසානං |
| ප – | එතම්හා, එතස්මා | එතෙහි, එතෙභි |
| ඡ – | එතස්ස | එතෙසං, එතෙසානං |
| ස – | එතම්හි, එතස්මිං | එතෙසු |

---

## ස්ත්‍රී ලිඞ්ගය

| | | |
|---|---|---|
| ප්‍ර – | එසා | එතා, එතායො |
| ද්වි – | එතං | එතා, එතායො |
| තෘ – | එතාය | එතාහි, එතාභි |
| කා – | එතාය | එතාහි, එතාභි |
| ච – | එතාය, එතිස්සා, එතිස්සාය, | එතාසං, එතාසානං |
| ප – | එතාය | එතාහි, එතාභි |
| ඡ – | එතාය, එතිස්සා, එතිස්සාය | එතාසං, එතාසානං |
| ස – | එතාය, එතායං, එතිස්සං, එතස්සං | එතාසු |

---

## නපුංසක ලිඞ්ගය

| | | |
|---|---|---|
| ප්‍ර – | එතං | එතානි |
| ද්වි – | එතං | එතානි |
| තෘ – | එතෙන | එතෙහි, එතෙභි |

සෙස්ස පුල්ලිඞ්ගයෙහි මෙනි.

**එත ශබ්දයෙන් තෙල (අර) යන අර්ථය කියත්.**

---

# ඉම ශබ්දය

## පුල්ලිඞ්ගය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | අයං | ඉමෙ |
| ද්වි – | ඉමං | ඉමෙ |
| තෘ – | අනෙන, ඉමිනා | එභි, එහි, ඉමෙභි, ඉමෙහි |
| කර – | අනෙන, ඉමිනා | එභි, එහි, ඉමෙභි, ඉමෙහි |
| ච – | අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| ප – | අස්මා, ඉමම්හා, ඉමස්මා | එභි, එහි, ඉමෙභි, ඉමෙහි |
| ඡ – | අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| ස – | අස්මිං, ඉමම්හි, ඉමස්මිං | එසු, ඉමෙසු |

## ඉත්ථි ලිඞ්ගය

| | | |
|---|---|---|
| ප්‍ර – | අයං | ඉමා, ඉමායො |
| ද්වි – | ඉමං | ඉමා, ඉමායො |
| තෘ – | ඉමාය | ඉමාභි, ඉමාහි |
| කර – | ඉමාය | ඉමාභි, ඉමාහි |
| ච – | අස්සාය, අස්සා, ඉමිස්සාය, ඉමිස්සා, ඉමාය | ඉමාසං, ඉමාසානං |
| ප – | ඉමාය | ඉමාභි, ඉමාහි |
| ඡ – | අස්සාය, අස්සා, ඉමිස්සාය ඉමිස්සා, ඉමාය | ඉමාසං, ඉමාසානං |
| ස – | අස්සං, ඉමිස්සං, ඉමිස්සා, ඉමායං | ඉමාසු |

## නපුංසක ලිඞ්ගය

| | | |
|---|---|---|
| ප්‍ර – | ඉදං, ඉමං | ඉමානි |
| ද්වි – | ඉදං, ඉමං | ඉමානි |
| තෘ – | අනෙන, ඉමිනා | එභි, එහි, ඉමෙභි, ඉමෙහි |

සෙස්ස පුල්ලිඞ්ගාං මෙනි

**ඉම ශබ්දයෙන් මේය යන අර්ථය කියත්.**

# අමු ශබ්දය

## පුල්ලිඞ්ගය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | අසු | අමූ |
| ද්වි – | අමුං | අමූ |
| තෘ – | අමුනා | අමූහි, අමූභි |
| කා – | අමුනා | අමූහි, අමූභි |
| ච – | අමුස්ස, අදුස්ස | අමූසං, අමූසානං |
| ප – | අමුම්හා, අමුස්මා | අමූහි, අමූභි |
| ෂ – | අමුස්ස, අදුස්ස | අමූසං, අමූසානං |
| ස – | අමුම්හි, අමුස්මිං | අමූසු |

---

## ස්ත්‍රී ලිඞ්ගය

| | | |
|---|---|---|
| ප්‍ර – | අසු | අමූ, අමුයො |
| ද්වි – | අමුං | අමූ, අමුයො |
| තෘ – | අමුයා | අමූහි, අමූභි |
| කා – | අමුයා | අමූහි, අමූභි |
| ච – | අමුස්සා, අමුයා | අමූසං, අමූසානං |
| ප – | අමුයා | අමූහි, අමූභි |
| ෂ – | අමුස්සා, අමුයා | අමූසං, අමූසානං |
| ස – | අමුස්සං, අමුයං | අමූසු |

---

## නපුංසක ලිඞ්ගය

| | | |
|---|---|---|
| ප්‍ර – | අදුං | අමූනි |
| ද්වි – | අදුං | අමූනි |
| තෘ – | අමුනා | අමූහි, අමූභි |

සෙස්ස පුල්ලිඞ්ගය මෙනි.

**අමු ශබ්දයෙන් අසුවල් යන අර්ථය කියත්**

---

**විශෙෂ:-**

i අමු ශබ්දයෙන් පරව සකාරාගමයෙන් සිද්ධවූ අමුක ශබ්දයක්ද ඇත්තේය. එය ලිඞ්ගත්‍රයෙහිම බුද්ධ-කඤ්ඤා-චිත්ත ශබ්දයන් මෙන් වරනැගේ.

අමුකො-අමුකා
අමුකා-අමුකා, අමුකායො
අමුකං-අමුකා-අමුකානි

යනාදි වශයෙනි.

ii අමුක යන්නෙහි ම හට සකාරාදෙශව සිද්ධවූ අසුක ශබ්දයක්ද එකී අර්ථයෙහිම ඇත්තේය. එයද ලිඞ්ගත්‍රයෙහි අමුක ශබ්දය මෙන්ම වරනැගේ.

---

## කිං ශබ්දය

(බොහෝ තන්හි කිංශබ්දයට කකාරාදෙශව ක ශබ්දය වශයෙන් වරනැගේ)

### පුල්ලිඞ්ගය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍ර – | කො | කෙ |
| ද්වි – | කං | කෙ |
| තෘ – | කෙන | කෙහි, කෙභි |
| ක – | කෙන | කෙහි, කෙභි |
| ච – | කස්ස, කිස්ස | කෙසං, කෙසානං |
| ප – | කම්හා, කස්මා | කෙහි, කෙභි |
| ඡ – | කස්ස, කිස්ස | කෙසං, කෙසානං |
| ස – | කම්හි, කිම්හි, කස්මිං, කිස්මිං | කෙසු |

---

### ස්ත්‍රී ලිඞ්ගය

| | | |
|---|---|---|
| ප්‍ර – | කා | කා, කායො |
| ද්වි – | කං | කා, කායො |
| තෘ – | කාය | කාහි, කාභි |
| ක – | කාය | කාහි, කාභි |
| ච – | කස්සා, කාය | කාසං, කාසානං |
| ප – | කාය | කාහි, කාභි |
| ඡ – | කස්සා, කාය | කාසං කාසානං |
| ස – | කස්සං, කායං | කාසු |

---

### නපුංසක ලිඞ්ගය

" අහං " පච්චිස්සාමි –මයං " පච්චිස්සාම

### කම්මනි අත්තනො පදෙ

" සො " පච්චිස්සතෙ තෙ " පච්චිස්සන්තෙ

" ත්වං " පච්චිස්සසෙ–තුම්හෙ " පච්චිස්සව්හෙ

" අහං " පච්චිස්සං –මයං " පච්චිස්සාම්හෙ

භාවෙ–භූයිස්සති භූයිස්සතෙ

---

## 8. කාලාතිපත්ති

කාලාතිපත්ති ස්සා–ස්සංසු–ස්සෙ–ස්සථ–ස්සං–ස්සම්හා—
ස්සථ–ස්සිංසු–ස්සසෙ–ස්සව්හෙ–ස්සං–ස්සාම්හසෙ.
ක්‍රියාතිපන්නෙ'තීතෙ කාලාතිපත්ති

---

### කත්තරි පරස්සපදෙ

සො ඔදනං අපචිස්සා – තෙ ඔදනං අපචිස්සංසු
ත්වං ,, අපචිස්සෙ – තුම්හෙ ,, අපචිස්සථ
අහං ,, අපචිස්සං – මයං ,, අපචිස්සම්හා

### කත්තරි අත්තනොපදෙ

සො ,, අපචිස්සථ – තෙ ,, අපචිස්සිංසු
ත්වං ,, අපචිස්සසෙ – තුම්හෙ ,, අපචිස්සව්හෙ
අහං ,, අපචිස්සං – මයං ,, අපචිස්සාම්හසෙ

### කම්මනි පරස්සපදෙ

තෙන තයා මයා වා } සො ඔදනො අපච්චිස්සා – තෙ ඔදනා අපච්චිස්සංසු
,, ත්වං ,, අපච්චිස්සෙ – තුම්හෙ ,, අපච්චිස්සථ
,, අහං ,, අපච්චිස්සං – මයං ,, අපච්චිස්සම්හා

### කම්මනි අත්තනොපදෙ

,, සො ,, අපච්චිස්සථ – තෙ ,, අපච්චිස්සිංසු
,, ත්වං ,, අපච්චිස්සසෙ – තුම්හෙ ,, අපච්චිස්සව්හෙ
,, අහං ,, අපච්චිස්සං – මයං ,, අපච්චිස්සාම්හසෙ

භාවෙ–අභූයිස්සා අභූයිස්සථ

# හෙත්වත්ථො

"ධාතූහි ණෙ ණය ණාපෙ ණාපයා කාරිතානි හෙත්වත්ථෙ"

## වත්තමාන විභත්ති

### i ණෙ පච්චයෙ

| කත්තරි පරස්ස පදෙ | | | | කත්තරි අත්තනො පදෙ | | | |
|---|---|---|---|---|---|---|---|
| සො | සූදෙන | ඔදනං | පාචෙති | සො | සූදෙන | ඔදනං | පාචෙතෙ |
| තෙ | ,, | ,, | පාචෙන්ති | තෙ | ,, | ,, | පාචෙන්තෙ |
| ත්වං | ,, | ,, | පාචෙසි | ත්වං | ,, | ,, | පාචෙසෙ |
| තුම්හෙ | ,, | ,, | පාචෙථ | තුම්හෙ | ,, | ,, | පාචෙව්හෙ |
| අහං | ,, | ,, | පාචෙමි | අහං | ,, | ,, | පාචෙ |
| මයං | ,, | ,, | පාචෙම | මයං | ,, | ,, | පාචෙම්හෙ |

### ii ණය පච්චයෙ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සො | ,, | ,, | පාචයති | සො | ,, | ,, | පාචයතෙ |
| තෙ | ,, | ,, | පාචයන්ති | තෙ | ,, | ,, | පාචයන්තෙ |
| ත්වං | ,, | ,, | පාචයසි | ත්වං | ,, | ,, | පාචයසෙ |
| තුම්හෙ | ,, | ,, | පාචයථ | තුම්හෙ | ,, | ,, | පාචයව්හෙ |
| අහං | ,, | ,, | පාචයාමි | අහං | ,, | ,, | පාචයෙ |
| මයං | ,, | ,, | පාචයාම | මයං | ,, | ,, | පාචයම්හෙ |

### iii ණාපෙ පච්චයෙ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සො | ,, | ,, | පාචාපෙති | සො | ,, | ,, | පාචාපෙතෙ |
| තෙ | ,, | ,, | පාචාපෙන්ති | තෙ | ,, | ,, | පාචාපෙන්තෙ |
| ත්වං | ,, | ,, | පාචාපෙසි | ත්වං | ,, | ,, | පාචාපෙසෙ |
| තුම්හෙ | ,, | ,, | පාචාපෙථ | තුම්හෙ | ,, | ,, | පාචාපෙව්හෙ |
| අහං | ,, | ,, | පාචාපෙමි | අහං | ,, | ,, | පාචාපෙ |
| මයං | ,, | ,, | පාචාපෙම | මයං | ,, | ,, | පාචාපෙම්හෙ |

### iv ණාපය පච්චයෙ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සො | ,, | ,, | පාචාපයති | සො | ,, | ,, | පාචාපයතෙ |
| තෙ | ,, | ,, | පාචාපයන්ති | තෙ | ,, | ,, | පාචාපයන්තෙ |
| ත්වං | ,, | ,, | පාචාපයසි | ත්වං | ,, | ,, | පාචාපයසෙ |
| තුම්හෙ | ,, | , | පාචාපයථ | තුම්හෙ | ,, | ,, | පාචාපයව්හෙ |
| අහං | ,, | ,, | පාචාපයාමි | අහං | ,, | , | පාචාපයෙ |
| මයං | ,, | ,, | පාචාපයාම | මයං | ,, | ,, | පාචාපයම්හෙ |

## කම්මනි- i ණෙපච්චයෙ

| | |
|---|---|
| තෙන තයා } සුදෙන සො<br>මයා වා } (ඔදනො)පාචියති | තෙන තයා } සුදෙන සො<br>මයා වා } (ඔදනො)පාචීයතෙ |
| ,, සුදෙන තෙ පාචියන්ති | ,, සුදෙන තෙ පාචීයන්තෙ |
| ,, ,, ත්වං පාචියසි | ,, ,, ත්වං පාචීයසෙ |
| ,, ,, තුම්හෙ පාචියථ | ,, ,, තුම්හෙ පාචීයව්හෙ |
| ,, ,, අහං පාචියාමි | ,, ,, අහං පාචීයෙ |
| ,, ,, මයං පාචියාම | ,, ,, මයං පාචීයම්හෙ |

### ii ණයපච්චයෙ

පාචයීයති-පාචයීයන්ති ඉච්චාදි
පාචයීයතෙ-පාචයීයන්තෙ ඉච්චාදි

### iii ණාපෙපච්චයෙ

පාචාපීයති-පාචාපීයන්ති ඉච්චාදි
පාචාපීයතෙ-පාචාපීයන්තෙ ඉච්චාදි

### iv ණාපයපච්චයෙ

පාචාපයීයති-පාචාපයීයන්ති ඉච්චාදි
පාචාපයීයතෙ-පාචාපයීයන්තෙ ඉච්චාදි
යථායොගං දට්ඨබ්බං

---

## පඤ්චමී විභත්ති

(එත්ථ පන පඨමපුරිස මත්තං වක්ඛාම. තෙන නයෙන සෙස පුරිසාපි දට්ඨබ්බා)

| කත්තරි පරස්ස පදෙ | කත්තරි අත්තනො පදෙ |
|---|---|
| පාචෙතු-පාචෙන්තු | පාචෙතං-පාචෙන්තං |
| පාචයතු-පාචයන්තු | පාචයතං-පාචයන්තං |
| පාචාපෙතු-පාචාපෙන්තු | පාචාපෙතං-පාචාපෙන්තං |
| පාචාපයතු-පාචාපයන්තු | පාචාපයතං-පාචාපයන්තං |

| කම්මනි පරස්ස පදෙ | කම්මනි අත්තනොපදෙ |
|---|---|
| පාචියතු-පාචියන්තු | පාචියතං-පාචියන්තං |
| පාචයීයතු-පාචයීයන්තු | පාචයීයතං-පාචයීයන්තං |
| පාචාපීයතු-පාචාපීයන්තු | පාචාපීයතං-පාචාපීයන්තං |
| පාචපයීයතු-පාචාපයීයන්තු | පාචාපයීයතං-පාචාපයීයන්තං |

නයෙනා'නෙන සත්තම්‍යාදිසු ඉතර විභත්තිසුච ඤෙය්‍යං

අථ ගමුධාතුයාපි රූප මාලා දස්සීයතෙ. ගමු-ගතියං. ගච්ඡ ඉති ක්‍රියාබෙගා ලබ්භාති සබ්බත්ථ

## වත්තමානා

| කත්තරි | | කම්මනි | |
|---|---|---|---|
| පරස්සපදෙ | අත්තනොපදෙ | පරස්ස පදෙ | අත්තනො පදෙ |
| ගච්ඡති | ගච්ඡතෙ | ගච්ඡීයති | ගච්ඡීයතෙ |
| ගච්ඡන්ති | ගච්ඡන්තෙ | ගච්ඡීයන්ති | ගච්ඡීයන්තෙ |
| ගච්ඡසි | ගච්ඡසෙ | ගච්ඡීයසි | ගච්ඡීයසෙ |
| ගච්ඡථ | ගච්ඡව්හෙ | ගච්ඡීයථ | ගච්ඡීයව්හෙ |
| ගච්ඡාමි | ගච්ඡෙ | ගච්ඡීයාමි | ගච්ඡීයෙ |
| ගච්ඡාම | ගච්ඡාම්හෙ | ගච්ඡීයාම | ගච්ඡීයාව්හෙ |

## පඤ්චමී

| | | | |
|---|---|---|---|
| ගච්ඡතු | ගච්ඡතං | ගච්ඡීයතු | ගච්ඡීයතං |
| ගච්ඡන්තු | ගච්ඡන්තං | ගච්ඡීයන්තු | ගච්ඡීයන්තං |
| ගච්ඡ-ගච්ඡාහි | ගච්ඡස්සු | ගච්ඡීය-ගච්ඡීයාහි | ගච්ඡීයස්සු |
| ගච්ඡථ | ගච්ඡව්හො | ගච්ඡීයථ | ගච්ඡීයව්හො |
| ගච්ඡාමි | ගච්ඡෙ | ගච්ඡීයාමි | ගච්ඡීයෙ |
| ගච්ඡාම | ගච්ඡාමසෙ | ගච්ඡීයාම | ගච්ඡීයාමසෙ |

## සත්තමී

| | | | |
|---|---|---|---|
| ගච්ඡෙ-ගච්ඡෙය්‍ය | ගච්ඡෙථ | ගච්ඡීයෙ-ගච්ඡීයෙය්‍ය | ගච්ඡීයෙථ |
| ගච්ඡෙය්‍යුං | ගච්ඡෙරං | ගච්ඡීයෙය්‍යුං | ගච්ඡීයෙරං |
| ගච්ඡෙය්‍යාසි | ගච්ඡෙථො | ගච්ඡීයෙය්‍යාසි | ගච්ඡීයෙථො |
| ගච්ඡෙය්‍යාථ | ගච්ඡෙය්‍යව්හො | ගච්ඡීයෙය්‍යාථ | ගච්ඡීයෙය්‍යව්හො |
| ගච්ඡෙය්‍යාමි | ගච්ඡෙය්‍යං | ගච්ඡීයෙය්‍යාමි | ගච්ඡීයෙය්‍යං |
| ගච්ඡෙය්‍යාම | ගච්ඡෙය්‍යාම්හෙ | ගච්ඡීයෙය්‍යාම | ගච්ඡීයෙය්‍යාම්හෙ |

## පරොක්ඛා

| | | | |
|---|---|---|---|
| ජගාම-ජගම | ජගමිත්ථ | ජගාමිය-ජගමිය | ජගමීසිත්ථ |
| ජගමු | ජගමිරෙ | ජගමියු | ජගමීසිරෙ |
| ජගමෙ | ජගමිත්තො | ජගමියෙ | ජගමීසිත්තො |
| ජගමිත්ථ | ජගමිව්හො | ජගමීසිත්ථ | ජගමීසිව්හො |
| ජගම | ජගමි | ජගමිය | ජගමීසි |
| ජගමිම්හ | ජගමිම්හෙ | ජගමීසිම්හ | ජගමීසිම්හෙ |

## හීයත්තනි

| කත්තරි | | කම්මනි | |
|---|---|---|---|
| පරස්සපදෙ | අත්තනොපදෙ | පරස්සපදෙ | අත්තනොපදෙ |
| අගච්ඡා | අගච්ඡත්ථ | අගච්ඡීයා | අගච්ඡීයත්ථ |
| අගච්ඡූ | අගච්ඡත්ථුං | අගච්ඡීයූ | අගච්ඡීයත්ථුං |
| අගච්ඡො | අගච්ඡසෙ | අගච්ඡීයො | අගච්ඡීයසෙ |
| අගච්ඡත්ථ | අගච්ඡව්හං | අගච්ඡීයත්ථ | අගච්ඡීයව්හං |
| අගච්ඡ | අගච්ඡිං | අගච්ඡීය | අගච්ඡීයිං |
| අගච්ඡම්හා | අගච්ඡම්හසෙ | අගච්ඡීයම්හා | අගච්ඡීයම්හසෙ |

## අජ්ජතනී

| | | | |
|---|---|---|---|
| අගච්ඡි–අගච්ඡී | අගච්ඡා | අගච්ඡීයි | අගච්ඡීයා |
| අගච්ඡිංසු–අගච්ඡුං | අගච්ඡූ | { අගච්ඡීයිංසු<br>{ අගච්ඡීයුං | අගච්ඡීයූ |
| අගච්ඡො | අගච්ඡිසෙ | අගච්ඡීයො | අගච්ඡීයසෙ |
| අගච්ඡිත්ථ | අගච්ඡිව්හං | අගච්ඡීයිත්ථ | අගච්ඡීයිව්හං |
| අගච්ඡිං | අගච්ඡ | අගච්ඡීයිං | අගච්ඡීය |
| අගච්ඡිම්හා | අගච්ඡිම්හෙ | අගච්ඡීයිම්හා | අගච්ඡීයිම්හෙ |

## භවිස්සන්ති

| | | | |
|---|---|---|---|
| ගච්ඡිස්සති | ගච්ඡිස්සතෙ | ගච්ඡීයිස්සති | ගච්ඡීයිස්සතෙ |
| ගච්ඡිස්සන්ති | ගච්ඡිස්සන්තෙ | ගච්ඡීයිස්සන්ති | ගච්ඡීයිස්සන්තෙ |
| ගච්ඡිස්සසි | ගච්ඡිස්සසෙ | ගච්ඡීයිස්සසි | ගච්ඡීයිස්සසෙ |
| ගච්ඡිස්සථ | ගච්ඡිස්සව්හෙ | ගච්ඡීයිස්සථ | ගච්ඡීයිස්සව්හෙ |
| ගච්ඡිස්සාමි | ගච්ඡිස්සං | ගච්ඡීයිස්සාමි | ගච්ඡීයිස්සං |
| ගච්ඡිස්සාම | ගච්ඡිස්සාම්හෙ | ගච්ඡීයිස්සාම | ගච්ඡීයිස්සාම්හෙ |

## කාලාතිපත්ති

| | | | |
|---|---|---|---|
| අගච්ඡිස්සා | අගච්ඡිස්සථ | අගච්ඡීයිස්සා | අගච්ඡීයිස්සථ |
| අගච්ඡිස්සංසු | අගච්ඡිස්සිංසු | අගච්ඡීයිස්සංසු | අගච්ඡීයිස්සිංසු |
| අගච්ඡිස්සෙ | අගච්ඡිස්සසෙ | අගච්ඡීයිස්සෙ | අගච්ඡීයිස්සසෙ |
| අගච්ඡිස්සථ | අගච්ඡිස්සව්හෙ | අගච්ඡීයිස්සථ | අගච්ඡීයිස්සව්හෙ |
| අගච්ඡිස්සං | අගච්ඡිස්සං | අගච්ඡීයිස්සං | අගච්ඡීයිස්සං |
| අගච්ඡිස්සම්හා | අගච්ඡිස්සාම්හසෙ | අගච්ඡීයිස්සම්හා | { අගච්ඡීයිස්සා<br>{ ම්හාසෙ |

## ගණභෙදො

1 භූ සත්තායං – භවති භවන්තීත්‍යාදි – භූවාදි
2 රුධි ආවරණෙ – රුන්ධති රුන්ධන්තීත්‍යාදි – රුධාදි
3 දිවු කීළාදිම්හි – දිබ්බති දිබ්බන්තීත්‍යාදි – දිවාදි
4 සු සවණෙ – සුණොති සුණන්තීත්‍යාදි – ස්වාදි
5 කී දබ්බවිනිමයෙ – කිණාති කිණන්තීත්‍යාදි – කියාදි
6 ගහ උපාදානෙ – ගණ්හාති ගණ්හන්තීත්‍යාදි – ගහාදි
7 තනු විත්ථාරෙ – තනොති තනොන්තීත්‍යාදි – තනාදි
8 චුර ථෙය්‍යෙ – චොරෙති චොරෙන්තීත්‍යාදි – චුරාදි

---

## විකරණපච්චයා

1 භූවාදිතො අ
2 රුධාදිතො නිග්ගහීතපුබ්බඤ්ච
3 දිවාදිතො යො
4 ස්වාදිතො ණු ණා උණා ච
5 කියාදිතො නා
6 ගහාදිතො ප්ප ණ්හා
7 තනාදිතො ඔ යිරා
8 චුරාදිතො ණෙ ණයා

---

"යං තිකාලං තිපුරිසං–ක්‍රියාවාචී තිකාරකං
අතිලිඞ්ගං ද්විවචනං–තදක්ඛ්‍යාතන්ති වුච්චති"

**නිට්ඨිතා ආඛ්‍යාත පදමාලා**

# ආදර්ශ ක්‍රියාරූප මාලා

| වත්තමානා | පඤ්චමී | සත්තමී | පරොක්ඛා |
|---|---|---|---|
| භවති | භවතු | භවෙය්‍ය | බභූව |
| වසති | වසතු | වසෙය්‍ය | වවාස |
| ලභති | ලභතු | ලභෙය්‍ය | ලලාභ |
| භාසති | භාසතු | භාසෙය්‍ය | බභාස |
| සුණාති | සුණාතු | සුණෙය්‍ය | සුසාව |
| රුන්ධති | රුන්ධතු | රුන්ධෙය්‍ය | රුරුන්ධ-රුරොධ |
| දිබ්බති | දිබ්බතු | දිබ්බෙය්‍ය | දිදිබ්බ-දිදෙව |
| කරොති | කරොතු | කරෙය්‍ය | චකාර-චකර |
| රුජති | රුජතු | රුජෙය්‍ය | රරුජ |
| භුඤ්ජති | භුඤ්ජතු | භුඤ්ජෙය්‍ය | බුභුඤ්ජ |
| චොරෙති | චොරෙතු | චොරෙය්‍ය | චුචොර |
| වන්දති | වන්දතු | වන්දෙය්‍ය | වවන්ද |
| කම්පති | කම්පතු | කම්පෙය්‍ය | චකම්ප |
| තරති | තරතු | තරෙය්‍ය | තතාර |
| පොසෙති | පොසෙතු | පොසෙය්‍ය | පුපොස |
| ගොපෙති | ගොපෙතු | ගොපෙය්‍ය | ජුගොප |
| තොසෙති | තොසෙතු | තොසෙය්‍ය | තුතොස |
| නමති | නමතු | නමෙය්‍ය | නනාම |
| නන්දති | නන්දතු | නන්දෙය්‍ය | නනන්ද |
| පචති | පචතු | පචෙය්‍ය | පපාච |
| පතති | පතතු | පතෙය්‍ය | පපාත |
| පූජෙති | පූජෙතු | පූජෙය්‍ය | පුපූජ |
| බන්ධති | බන්ධතු | බන්ධෙය්‍ය | බබන්ධ |
| මොචෙති | මොචෙතු | මොචෙය්‍ය | මුමොච |
| යාචති | යාචතු | යාචෙය්‍ය | යයාච |
| රක්ඛති | රක්ඛතු | රක්ඛෙය්‍ය | රරක්ඛ |
| යුඤ්ජති | යුඤ්ජතු | යුඤ්ජෙය්‍ය | යුයුඤ්ජ |
| ගණ්හාති | ගණ්හාතු | ගණ්හෙය්‍ය | ජගාහ |
| තනොති | තනොතු | තනෙය්‍ය | තතාන-තතන |
| ධාවති | ධාවතු | ධාවෙය්‍ය | දධාව |
| හසති | හසතු | හසෙය්‍ය | ජහාස |
| චුම්බති | චුම්බතු | චුම්බෙය්‍ය | චුචුම්බ |
| දෙසෙති | දෙසෙතු | දෙසෙය්‍ය | දිදෙස |

| හියත්තනී | අජ්ජතනී | භවිස්සන්ති | කාලාතිපත්ති |
|---|---|---|---|
| අභවා | අභවී | භවිස්සති | අභවිස්සා |
| අවසා | අවසී | වසිස්සති | අවසිස්සා |
| අලභා | අලභි | ලභිස්සති | අලභිස්සා |
| අභාසා | අභාසී | භාසිස්සති | අභාසිස්සා |
| අසුණා | අසුණී | සුණිස්සති | අසුණිස්සා |
| අරුන්ධා | අරුන්ධී | රුන්ධිස්සති | අරුන්ධිස්සා |
| අදිබ්බා | අදිබ්බි | දිබ්බිස්සති | අදිබ්බිස්සා |
| අකරු | අකරි–අකාසි | කරිස්සති | අකරිස්සා |
| අරුජා | අරුජි | රුජිස්සති | අරුජිස්සා |
| අභුඤ්ජා | අභුඤ්ජි | භුඤ්ජිස්සති | අභුඤ්ජිස්සා |
| අචොරු | අචොරයි–චොරෙසි | චොරෙස්සති | අචොරිස්සා |
| අවන්දු | අවන්දි | වන්දිස්සති | අවන්දිස්සා |
| අකම්පා | අකම්පි | කම්පිස්සති | අකම්පිස්සා |
| අතරු | අතරි | තරිස්සති | අතරිස්සා |
| අපොසා | අපොසයි-පොසෙසි | පොසෙස්සති | අපොසිස්සා |
| අගොපා | අගොපයි | ගොපෙස්සති | අගොපිස්සා |
| අතොසා | අතොසයි–තොසෙසි | තොසෙස්සති | අතොසිස්සා |
| අනමා | අනමි | නමිස්සති | අනමිස්සා |
| අනන්දු | අනන්දි | නන්දිස්සති | අනන්දිස්සා |
| අපචා | අපචි | පචිස්සති | අපචිස්සා |
| අපතා | අපති | පතිස්සති | අපතිස්සා |
| අපූජා | අපූජි | පූජෙස්සති | අපූජිස්සා |
| අබන්ධා | අබන්ධි | බන්ධිස්සති | අබන්ධිස්සා |
| අමොචා | අමොචයි–මොචෙසි | මොචෙස්සති | අමොචිස්සා |
| අයාචා | අයාචි | යාචිස්සති | අයාචිස්සා |
| අරක්ඛා | අරක්ඛි | රක්ඛිස්සති | අරක්ඛිස්සා |
| අයුඤ්ජා | අයුඤ්ජි | යුඤ්ජිස්සති | අයුඤ්ජිස්සා |
| අගණ්හා | අගණ්හි | ගණ්හිස්සති | අගණ්හිස්සා |
| අහනා | අහනි | හනිස්සති | අහනිස්සා |
| අධාවා | අධාවි | ධාවිස්සති | අධාවිස්සා |
| අහසා | අහසි | හසිස්සති | අහසිස්සා |
| අචුම්බා | අචුම්බි | චුම්බිස්සති | අචුම්බිස්සා |
| අදෙසා | අදෙසයි–දෙසෙසි | දෙසිස්සති | අදෙසිස්සා |

---

උක්තානුසාරයෙන් සෙසු පුරුෂ වචනයන්හිද වරනැගිය යුතුයි.

# ආඛ්‍යාත පදමාලා ව්‍යාඛ්‍යා

## 1. වර්තමාන විභක්තිය

"වත්තමානා ති අන්ති සි ථ මි ම තෙ අන්තෙ සෙ ව්හෙ එ ම්හෙ" යන සූත්‍රයෙන් ති අන්ති යනාදි ප්‍රත්‍යය දෙළොස වර්තමාන විභක්ති නම් වේ.

**"වත්තමානා පච්චුප්පන්නෙ"** යනු වර්තමාන විභක්ති විධාන සූත්‍රයි. පච්චුප්පන්නෙ-දැන් පවත්නා කාලයෙහි (ක්‍රියාවෙහි); වත්තමානා-වර්තමාන විභක්තිය වේ.

### කර්තෘ කාරක පරස්මෛ පදයෙහි

ප්‍රථම පුරුෂය - සො, හෙතෙම; ඔදනං, බත; පචති, පිසයි.
තෙ, ඔහු තුමූ; ,, පචන්ති, පිසත්
මධ්‍යම පුරුෂය- ත්වං, තෝ; ,, පචසි, පිසහි
තුම්හෙ, තොපි; ,, පචථ, පිසහු
උත්තම පුරුෂය-අහං, මම; ,, පචාමි, පිසමි
මයං, අපි; ,, පචාම, පිසමු

### කර්තෘ කාරක ආත්මනෙ පදයෙහි

ප්‍රථම පුරුෂය -සො, හෙතෙම; ඔදනං, බත; පචතෙ, පිසයි
තෙ, ඔහු තුමූ; ,, පචන්තෙ, පිසත්
මධ්‍යම පුරුෂය-ත්වං, තෝ; ,, පචසෙ, පිසහි
තුම්හෙ, තොපි; ,, පචව්හෙ, පිසහු
උත්තම පුරුෂය-අහං, මම; ,, පචෙ, පිසමි
මයං, අපි ,, පචාම්හෙ, පිසමු

### කර්ම කාරක පරස්මෛ පදයෙහි

ප්‍රථම: තෙන තයා මයාවා, ඔහු විසින් හෝ තා විසින් හෝ මා විසින් හෝ;
සො (ඔදනො, ආහාරවූ) හෙතෙම;
පච්චති, පිසනු ලැබේ
,, තෙ, ඔහු තුමූ; පච්චන්ති, පිසනු ලැබෙත්

| | | | |
|---|---|---|---|
| මධ්‍යම:(තෙන තයා මයාවා) | ත්වං, තෝ; | පච්චසි, | පිසනු ලැබෙහි |
| ,, | තුම්හෙ, තොපි; | පච්චථ, | පිසනු ලබහු |
| උත්තම: ,, | අහං, මම; | පච්චාමි, | පිසනු ලබමි |
| ,, | මයං, අපි; | පච්චාම, | පිසනු ලබමු |

### කර්මකාරක ආත්මනෙ පදයෙහි

ප්‍රථම: තෙන තයා මයාවා, ඔහු විසින් හෝ තා විසින් හෝ මා විසින් හෝ;

| | | | |
|---|---|---|---|
| | සො (ඔදනො, ආහාරවූ) හෙතෙම; | පච්චතෙ | පිසනු ලැබේ |
| ,, | තෙ, ඔහු තුමූ; | පච්චන්තෙ, | පිසනු ලැබෙත් |
| මධ්‍යම ,, | ත්වං, තෝ; | පච්චසෙ, | පිසනු ලැබෙහි |
| ,, | තුම්හෙ, තොපි | පච්චව්හෙ, | පිසනු ලබහු |
| උත්තම ,, | අහං, මම; | පච්චෙ, | පිසනු ලබමි |
| ,, | මයං, අපි; | පච්චාම්හෙ, | පිසනු ලබමු |

භාවෙ, භාවකාරකයෙහි; භූයති භූයතෙ, (ඔහුවිසින් හෝ තා විසින් හෝ මා විසින් හෝ වර්තමානයෙහි) වීමයි.

---

**විස්තර:-**

ආරද්ධා' නිට්ඨිතං කිච්චං-වත්තමානන්ති වුච්චති
වත්තමාන සමීපඤ්ච-වත්තමානමිහි වුච්චති

පටන්ගත් නොනිමි ක්‍රියාව වර්තමානයයි කියනු ලැබේ. වර්තමානයට සමීපකාලයද වර්තමාන නමි. පටන් ගෙන මෙතාක් අවසන් නොවී දැන් පවත්නා ක්‍රියාව වර්තමාන නාමයෙන් කියනු ලැබේ. එසේම වර්තමානයට අතීතයෙන් සමීපවූ හෝ අනාගතයෙන් සමීපවූ හෝ ක්‍රියාවද වර්තමාන නාමයෙන්ම හඳුන්වනු ලැබේ.

කුතො භවං ආගච්ඡති-පින්වත් තෙම කොයින් එසිදැයි අවුත් හිඳගත් පුරුෂයාගෙන් යමෙකු විචාළ කල පාටලී පුත්තතො ආගච්ඡාමි-පැළලුප් නුවරින් එමියි කියයි. මෙහි ආගච්ඡති ආගච්ඡාමි යන ක්‍රියා **සමීප අතීතයෙහි වර්තමානයි**. යාව අහං ආගච්ඡාමි-යම් තාක් මම එම්ද යනු ගමන ක්‍රියාව තවම පටන් නොගත් කෙනෙකුන් විසින් කියන ලද්දක් බැවින් සමීප **අනාගතයෙහි වර්තමානයි**.

සංස්කෘත වෛයාකරණයෝ වනාහි වර්තමානය සතර වැදෑරුම් කොට දක්වත්. එනම්:-

"ප්‍රවෘත්තොපරතශ්චෛව-වෘත්තාවිරත එව ච
නිත්‍ය ප්‍රවෘත්තඃ සාමීප්‍යො-වර්තමානශ්චතුර්විධඃ"

යනුවෙන් **ප්‍රවෘත්තොපරතය, වෘත්තාවිරතය, නිත්‍ය ප්‍රවෘත්තය, සාමීප්‍යය** යන සතරයි. පළමු පැවති ක්‍රියාව වළක් වනුයේ ප්‍රවෘත්තොපරත නමි. මංසං න ඛාදති යනු උදාහරණයි. ඉහ කුමාරා කීළන්ති-මෙහි කුමරුවෝ කෙළිත් යයි කෙළිමඬලක් දැක කියයි. එකෙණෙහි කුමරුවන්ගේ ක්‍රීඩාවක් නැතත් පළමු පැවති ක්‍රියාවම නොවැළක පවත්නා බැවින් එය වෘත්තාවිරත වර්තමානයයි. පබ්බතා තිඪන්ති යනු නිත්‍ය ප්‍රවෘත්ත වර්තමානයට උදාහරණයි. එසො අහං ආගච්ඡාමි- යනු අතීත අනාගත සමීප කාල වශයෙන්වූ සාමීප්‍ය වර්තමාන නමි.

---

## 2. පඤ්චමී විභක්තිය

"පඤ්චමී තු අන්තු හි ථ මි ම-තං අන්තං ස්සු වෛහා එ ආමසෙ" යන සූත්‍රයෙන් තු අන්තු යනාදි ප්‍රත්‍යය දෙළොස පඤ්චමී විභක්ති නම් වේ.

**"ආණත්‍යාසිඨෙ'නුත්ත කාලෙ පඤ්චමී"** යනු පඤ්චමී විභක්ති විධාන සූත්‍රයි. ආණත්ති ආසිඨෙ-නියොගයක්ද ආශීර්වාද යක්ද හැඟෙන කල්හි; අනුත්තකාලෙ-වර්තමාන කාලයෙහි හෝ කාලභෙදයක් වශයෙන් නොකියනලද කාලයෙහි හෝ; පඤ්චමී- පඤ්චමී විභක්තිය වේ.

### කර්තෘකාරක පරස්සෙම පදයෙහි

(සො-තෙ යනාදීන්ට හා ඔදනං යන්නටද පදාර්ථ පෙරසේමැයි)

| | |
|---|---|
| පචතු – පිසේවා | පචන්තු – පිසෙත්වා |
| පච – පචාහි – පිසෙහිවා | පචථ – පිසෙහුවා |
| පචාමි – පිසෙම්වා | පචාම – පිසෙමුවා |

### කර්තෘකාරක ආත්මනෙ පදයෙහි

පචතං – පිසේවා පචන්තං – පිසෙත්වා
යනාදි වශයෙන් පරස්සෙම පදයෙහි මෙන් අර්ථ දතයුතුයි.

### කම්මකාරක පරස්සපද පදයෙහි

පච්චතු – පිසනු ලැබේවා· පච්චන්තු පිසනු ලැබෙත්වා
පච්ච පච්චාහි – පිසනු ලැබෙහිවා පච්චථ –පිසනු ලබනුවා
පච්චාමි – පිසනු ලබම්වා පච්චාම–පිසනු ලබමුවා

### කම්මකාරක අත්තනෝ පදයෙහි

පච්චතං – පිසනු ලැබේවා පච්චන්තං – පිසනු ලැබෙත්වා යනාදි වශයෙන් කම්මකාරක පරස්සෙම පදය මෙන් අර්ථ දත යුතුයි.

භාවෙ-භාවකාරකයෙහි; භූයතු භූයතං–විමයි.

---

**විස්තර:–**

ආණත්ති හා ආසිඨ යන අර්ථ දෙක්හි පඤ්චමී විභක්තිය වේ. එහි ආණත්තිය නම් නියෝගයයි. අාඥ කිරීමයි. ආසිඨය නම් ඉෂ්ට වූ දෙයක් ප්‍රාර්ථනා කිරීමයි. ආශීර්වාද ක්‍රියා නමින් හෙළබස ලැබෙනුයේ මේ ආසිඨ පඤ්චමියයි. මේ අර්ථ දෙක්හි වූ පඤ්චමිය අනුත්ත කාලයෙහි වෙයි. අනුත්ත කාලය නම් සමීපයෙහි කියනලද (වර්තමාන) කාලයයි. නොහොත් කාල විශෙෂයක් නියම නොකොට කියනලද කාලය හෝයි. කියනලද මැයි. රූපසිද්ධියෙහි:–"අනු සමීපෙ උත්ත කාලො අනුත්ත කාලො- **පච්චුප්පන්න කාලොති අත්ථො.** න උත්ත කාලොති වා අනුත්ත කාලො තස්මිං අනුත්ත කාලෙ, **කාලමනාමසිත්වාපි හොතීති අත්ථො"** යනුයි.

අනුත්ත කාලය වැටෙන අර්ථ දෙපක්ෂයෙන් සමීප කාලයයි කී වර්තමානයෙහිම පඤ්චමිය යෙදෙන බව බාලාවතාර කර්තෘ පාද යන්ගේ පිළිගැනීමයි. එහි මෙය දක්වත්

"නියොගං ජඤ්ඤා ආණත්තිං–ආසිඨං ඉඨ පත්ථනං
අනුත්ත කාලො සාමීපෙ–වුත්තො කාලො'ධ ඉච්ඡිතො"

වනුයි.

ආණත්තිය = දෙවදත්තො'දනිං ඔදනං **පචතු**
ආසිඨය = සො සුඛී **භවතු**
යනු උදාහරණයි.

තව ද ආණත්‍යාසිඨෙ යනාදි සූත්‍රයෙහි නැවත කී "කාල" ශබ්ද ග්‍රහණයෙන් **විධි– නිමන්ත්‍රණ– අධ්‍යෙෂණ– අනුමති– ප්‍රාර්ථනා– ප්‍රාප්තකාල** යනාදි අර්ථයන්හිද පඤ්චමිය වන බැව් වෛයාකරණයෝ කියත්. එහි විධි නම් දාසාදීන් වැනි හීනයන්ට කරන විධානයයි. නිමන්ත්‍රණ නම් දානවස්තු ප්‍රතිග්‍රහණාදිය පිණිස පැවරීමය. අධ්‍යෙෂණ නාම් ආදර පූර්වක ආරාධනාවය. අනුමති නම් ක්‍රියාව කරනු කැමැත්තෙන් සිටින්නහුට එය අනුදැනීමය. ප්‍රාර්ථනා නම් යමක් ඉල්ලීම හෝ පැතීමය. ප්‍රාප්තකාලය නම් ක්‍රියාව කිරීමට සුදුසු කාලය පැමිණි බව කියා නියම කිරීමය. මොවුන්ට යථා ක්‍රමයෙන් උදාහරණ මෙසේයි.

විධි – ඉධ භවං නිසීදතු
නිමන්ත්‍රණ – **අධිවාසෙතු** මේ භන්තෙ භගවා භොජනං
අධ්‍යෙෂණ – **දෙසෙතු** භන්තෙ භගවා ධම්මං
අනුමති – **පුච්ඡ** වාසව මං පඤ්හං
ප්‍රාර්ථනා – **දදාහි** මෙ ගාමවරානි පඤ්ච
ප්‍රාප්තකාල – සම්පත්තො තෙ කාලකරණෙ කාලො, කටං **කරෙතු** භවං

පාළියෙහි අනාගතාශංසන විභක්තියක්ද ඇතිබව ඇතැම් ආචාර්‍ය්‍යකෙනෙක් පවසත්. ආගච්ඡතු මෙ මාතා, මං නෙස්සතු යනු උදාහරණයි. එය කච්චායනාදි ව්‍යාකරණයන්හි සංගෘහීත නුවූවත් ජිනවචනයෙහි එබඳු ක්‍රියා රූප ලැබෙන බැවින් එයත් සමග ආඛ්‍යාත විභක්ති නවයක් කොට ගැන්මද අනුචිත නොවේ. එසේ නම් පඤ්චමියෙහි තු අන්තු යනාදි ප්‍රත්‍යය යෙදුනාක් මෙන් ඒ අනාගතාශංසනය විභක්තියට ස්සතු–ස්සන්තු යනාදි ප්‍රත්‍යය යෙදිය යුතුය.

---

## 3. සප්තමී විභක්තිය.

"සත්තමී එය්‍ය එය්‍යුං එය්‍යාසි එය්‍යාථ එය්‍යාමි එය්‍යාම–එථ එරං එථො එය්‍යව්හො එය්‍යං එය්‍යාමේහ" යන සූත්‍රයෙන් එය්‍ය එය්‍යුං යනාදි ප්‍රත්‍යය දොළොස සත්තමී විභත්ති නම් වේ.

**"අනුමති පරිකප්පත්ථෙසු සත්තමී"** යනු සප්තමී විභක්ති විධාන සූත්‍රයි. අනුමති පරිකප්පත්ථෙසු–අනුමති අර්ථයක් හා පරි

කාලප්‍රාප්තියක් හැඟෙන කල්හි; (අනුත්ත කාලෙ-වර්තමාන කාලයෙහි හෝ කාලභේදයක් නොකියනලද කාලයෙහි හෝ) සත්තමි-සප්තමී විභක්තිය වේ

**කර්තෘකාරක පරස්මෛපදයෙහි**

| | |
|---|---|
| පචෙ-පචෙය්‍ය-පිසන්නේය | පචෙය්‍යුං - පිසන්නාහුය |
| පචෙය්‍යාසි -පිසන්නෙහි | පචෙය්‍යාථ- පිසන්නහු |
| පචෙය්‍යාමි -පිසන්නෙමි | පචෙය්‍යාම- පිසන්නෙමු |

කර්තෘකාරක ආත්මනෙ පදයෙහිද පරස්මෛපදය මෙනි.

**කර්මකාරක පරස්මෛ පදයෙහි**

| | |
|---|---|
| පච්චෙ-පච්චෙය්‍ය-පිසනු ලබන්නේය | පච්චෙය්‍යුං පිසනු ලබන්නාහුය |
| පච්චෙය්‍යාසි -පිසනු ලබන්නෙහි | පච්චෙය්‍යාථ-පිසනු ලබන්නහු |
| පච්චෙය්‍යාමි -පිසනු ලබන්නෙමි | පච්චෙය්‍යාම-පිසනු ලබන්නෙමු |

කර්මකාරක ආත්මනෙපදයෙහිද පරස්මෛපදය මෙනි.

භාවෙ-භාවකාරකයෙහි; භූයෙ භූයෙය්‍ය භූයෙථ-වීමයි.

---

**විස්තර:-**

මේ විභක්තිය අනුමති පරිකල්ප යන අර්ථයන්හි යෙදේ. එහි **අනුමතිය** නම් ක්‍රියාවක් කරනු කැමැත්තාවූ යම් කිසිවෙකුහට අනුදැනීමයි. ක්‍රියාව කිරීමට කැමැත්තෙන් සිටින්නෙකුට එය කරන්ට නියම කිරීමය යනු භාවයි. **"සංඝො ඉත්ථනාමං උපසම්පාදෙය්‍ය"** යනු උදාහරණයි. සංඝ තෙම මෙනම් ඇත්තා උපසම්පදා කරන්නේය යනු අර්ථයි. ඉත්ථනාමයා උපසම්පදා කිරීමට සංඝයා කැමැත්තෙන් සිටියි. ඊට සුදුසු ප්‍රස්තාවය එළඹි කල්හි දැන් සංඝයා ඔහු උපසම්පදා කරන්නේයයි (උපසම්පදා කට යුතුයයි) අනුදනියි. එහෙයින් **"උපසම්පාදෙය්‍ය"** යනු අනුමත්‍යර්ථයෙහි සප්තමී විභක්තියයි.

**පරිකල්පය** නම් ක්‍රියාවෙහි නිශ්චයක් නැති බවයි. ඉදින් මේ නම් කියා අනියමින් සැලකීමයි. යදි සො නගරං ගච්ඡෙය්‍ය ධනං ලභෙය්‍ය-ඉදින් හෙතෙම නුවරට යන්නේ නම් ධනය ලබන්නේය යනු උදාහරණයි. මෙහි නුවරට ගියොත් ධනය ලබන්නේය, නොගියොත් නොලබන්නේය. එහෙයින් ධනය ලැබීම් ක්‍රියාව අවිනිශ්චිතය. අනියමය. මෙය පරිකල්පාර්ථයයි. එබැවින් **ගච්ඡෙය්‍ය-ලභෙය්‍ය** යනු පරිකල්පාර්ථයෙහි සප්තමී විභක්තියි.

සචෙ සො පුඤ්ඤං කරෙය්‍ය සග්ගං ගච්ඡෙය්‍ය යනාදියද මෙසේම දතයුතුයි. මේ පරිකල්පාර්ථයෙහි යදි-සචෙ යනාදි අනියමාර්ථ සූචක නිපාතයෙකුදු යොදනු ලැබේ.

මේ ක්‍රියාව විධි, නිමන්ත්‍රණ, ප්‍රශ්න, ප්‍රාර්ථනා, ප්‍රාප්තකාලාදි යෙහිද යෙදේ. උදාහරණ:-

**විධි** - භවං පත්තං පචෙය්‍ය

**නිමන්ත්‍රණ** - ඉධ භවං භුඤ්ජෙය්‍ය

**ප්‍රශ්න** - සො භත්තං පචෙය්‍ය? උදාහු බ්‍යඤ්ජනං වා?

**ප්‍රාර්ථනා** - අහො වත සො මම ගෙහං ආගච්ඡෙය්‍ය

**ප්‍රාප්තකාල** - යදි සංඝස්ස පත්තකල්ලං

සංඝො උපොසථං කරෙය්‍ය-යනුයි.

මේ විභක්තිය යෙදෙන අර්ථ අතුරෙන් අනුමතිය විධික්‍රියාවෙහිද පරිකල්පය අසම්භාව්‍ය ක්‍රියාවෙහිද ගෙළබසෙහි අනාගත වේ. අනියමාර්ථයෙහි වූ "නම්" නිපාතය යෙදෙන සැල්හි වනාහි "ගියේ නම්-යයි නම් යනාදි වශයෙන් අතීත වර්තමාන ක්‍රියාවන්හි ඇතුළත් වේ.

---

## 4. පරොක්ෂා විභක්තිය.

"පරොක්ඛා අ උ එ ත්ථ අ ම්හ-ත්ථ රෙ ත්ථො ව්හො ඉ ම්හෙ" යන සූත්‍රයෙන් අ උ යනාදි ප්‍රත්‍යය දොළොස පරොක්ෂා විභක්ති නම් වේ.

**"අපච්චක්ඛෙ පරොක්ඛාතීතෙ"** යනු පරොක්ෂා විභක්ති විධාන සූත්‍රයි. අපච්චක්ඛෙ-ප්‍රත්‍යක්ෂ නුවූ; අතීතෙ-අතීතකාලයෙහි; පරොක්ඛා-පරොක්ෂා විභක්තිය වේ.

**කර්තෘකාරක පරස්මෛ පදයයි**

පපච - පිසුවේලු   පපචු - පිසුවාහුලු
පපචෙ - පිසුවෙහිලු   පපචිත්ථ - පිසුවහුලු
පපච - පිසුවෙම්ලු   පපචිම්හ - පිසුවෙමුලු

කර්තෘකාරක ආත්මනෙපදයද මෙසේමැයි.

**කර්මකාරක පරස්මෛ පදයෙහි**

පපච්ච - පිසනු ලැබුවේලු   පපච්චු - පිසනු ලැබුවාහුලු
පපච්චෙ - පිසනු ලැබුවෙහිලු   පපච්චිත්ථ - පිසනු ලැබුවහුලු
පපච්ච - පිසනු ලැබුවෙම්ලු   පපච්චිම්හ - පිසනු ලැබුවෙමුලු

කර්මකාරක ආත්මනෙපදයද මෙසේමැයි.

භාවෙ-භාවකාරකයෙහි; භූය භූයිත්ථ-බභූය බභූයිත්ථ (පරොක්ෂ අතීතයෙහි) වීමයි.

---

**විස්තර:-**

තමා ප්‍රත්‍යක්ෂ වශයෙන් නොදත් දෙය කීමෙහි මේ පරොක්ෂා විභක්තිය යොදනු ලැබේ. තම ඇසින් නුදුටු කනින් නොඇසූ යනාදි ඉන්ද්‍රිය විෂය නුවූ අතීත ක්‍රියාවක්ම මෙයින් පවසයි. **සො කිර රාජා බභූව**- හෙතෙම රජ වීලු යනු උදාහරණයි. ඔහුගේ රජවීම තමා ප්‍රත්‍යක්ෂ වශයෙන් නොදත් ක්‍රියාවකි. එය අනුශ්‍රැති (ආරංචි) වශයෙන් අසනලද්දකි. එහෙයින් බභූව යනු පරොක්ෂා විභක්තියි.

දෙශනා පාළියෙහි මේ විභක්තිය (ක්‍රියාව) බහුල වශයෙන් නොදක්නා ලැබේ. එහෙත් ප්‍රකරණ ග්‍රන්ථයන්හි ඇතැම් විට යොදා තිබේ.

"සො කුච් සන්ධිගහණං බුබොධ"-
"ගනතුං සයං අපදනාය සුසොච නුනං"-
"රාජා ච මොදස්සුජලං මුමොච"-
"සරජීති ධරණී පතිත මාතනාන"-

යනාදි වශයෙනි.

පාළියෙහි ආහ-ආහු යනාදිය පරොක්ෂාවෙහි යෙදෙන බව ව්‍යාකරණයෙහි දක්වතත් ඇතැම් තන්හි ඉන්ද්‍රියවිෂයවූ ක්‍රියාවෙහිද එය යෙදෙන බැවින් ප්‍රත්‍යක්ෂ තන්හිද පරොක්ෂා විභක්තිය වන බව දතයුතුයි.

අහං පපව-මම පිසුවෙම්ලු යන තැන තමා පිළිබඳ හෙයින් ප්‍රත්‍යක්ෂනුවූ බවක් කොයින් වේද? එහෙයින් උත්තම පුරුෂයෙහි පරොක්ෂාව නොයෙදිය හැකිදැයි සිතිය හැකිය. විස්මරණයෙහි (මතක නැතිවීමෙහි) හා සිහිමුළාව තන්දෙඩවීම් ආදියෙහි මම කොළෙම්ලු- මම පිසුවෙම්ලු යනාදි වශයෙන් තමා පිළිබඳව වුවත් පරොක්ෂාව යෙදෙන බව දතයුතුයි.

හෙළුබස මේ විභක්තිය හැඳින්වීමෙහි විශෙෂ ක්‍රියාවක් නොමැතියි. එහි ත්‍රෛකාලික ක්‍රියාවන්ගෙන් පරව ශ්‍රැති සූචක ල-ලූ නිපාත යෙදීමෙන් පරොක්ෂාව හඟවයි.

---

# 5. හීයත්තනී විභත්තිය

"හීයත්තනි ආ ඌ ඔ ත්ථ අ ම්හා–ත්ථ ත්ථුං සෙ ව්හං ඉං ම්හසෙ" යන සූත්‍රයෙන් ආ ඌ යනාදි ප්‍රත්‍යය දෙළොස හීයත්තනී විභත්ති නම් වේ.

**"හීයොපභුති පච්චක්ඛෙ හීයත්තනී"** යනු හීයත්තනී විභක්ති විධාන සූත්‍රයි. පච්චක්ඛෙ–ප්‍රත්‍යක්ෂ වූ හෝ (ප්‍රත්‍යක්ෂ නුවූ) හීයොප්පභුති–ඊයේ පටන් කොට ඇති අතීතකාලයෙහි; හීයත්තනි–හීයත්තනී විභත්තිය වේ.

**කත්තෘකාරක පරස්සෙම පදයෙහි**

අපචා (ඊයේ පටන් අතීතයෙහි)පිසුවේය. අපචූ
(ඊයේ පටන් අතීතයෙහි) පිසුවාහුය
අපචො – ,, ,, පිසුවෙහි – අපචත්ථ ,, පිසුවහු
අපච – ,, ,, පිසුවෙමි – අපචම්හා ,, පිසුවෙමු
කත්තෘකාරක ආත්මනෙ පදයද මෙසේමැයි.

**කම්කාරක පරස්සෙම පදයෙහි**

අපච්චා(ඊයේ පටන් අතීතයෙහි) පිසනු ලැබී
අපච්චූ–(ඊයේ පටන් අතීතයෙහි)පිසනු ලැබූ
අපච්චො ,, පිසනු ලැබුවෙහි –අපච්චත්ථ ,, පිසනු ලැබුවහු
අපච්ච ,, පිසනු ලැබුවෙමි –අපච්චම්හා ,, පිසනු ලැබුවෙමු

භාවෙ–භාවකාරකයෙහි; අභූයත්ථ භූයත්ථ අභූයා භූයා–(ඊයේ පටන් අතීතයෙහි) වීමයි.

**විස්තර:–**

හීයො භවා හීයත්තනී–ඊයේ වූවා හීයත්තනී නම් තද්උපචාර වශයෙන් ඊයේ පටන් අතීතයෙහිවූ ක්‍රියාව හීයත්තනීයයි කියනු ලැබේ. එය ප්‍රත්‍යක්ෂ වූ හෝ නුවූ ක්‍රියාවකි. ඊයේ පටන් අතීතයෙහි වූ ක්‍රියාවක් සඳහා එය යොදනු ලැබේ. සමීපාතීතයෙහි සිඬවූ ක්‍රියාව අජ්ජතනී නාමයෙන් කියන බැවින් මෙය දූරාතීතය ගහවයි. එහෙත් සාමාන්‍ය අතීතය සඳහාද මෙය බොහෝසේ යෙදෙයි. මේ හීයත්තනියෙහි හා අජ්ජතනී කාලාතිපත්ති විභත්තීන්හිද ධාතුවට පූර්ව කිසි තැනෙක අකාරයක් ආගම වේ.

මේ දක්වූ වත්මාන–පඤ්චමී–සත්තමී–හීයත්තනී විභත්ති සතරට **සාර්ඛධාතුක** යන සංඥාවක් ඇත්තේය. එහෙයින් පරොක්ඛා–අජ්ජතනී–භවිස්සන්ති-කාලාතිපත්ති යන සතර **අසාර්ඛධාතුක** නම් වේ.

හෙළබස මේ විභත්තිය හැඳින්වීමට විශෙෂ ක්‍රියාවක් නැත්තේය. එය සාමාන්‍ය අතීතකාලික ක්‍රියාවෙන්ම හඳුන්වයි. එහෙයින් "අද පටන් අතීතයෙහි" යනු ඒ අර්ථය දීමට හෙළු බසෙහි අමුතුවෙන් යොදන්ට වෙයි.

---

## 6. අජ්ජතනී විභත්තිය

"අජ්ජතනී ඊ උං ඔ ත්ථ ඉං ම්හා-ආ ඌ සෙ ව්හං අ ම්හෙ" යන සූත්‍රයෙන් ඊ උං යනාදි ප්‍රත්‍යය දොළොස අජ්ජතනී විභත්ති නම් වේ.

**"සමීපෙ'ජ්ජතනී"** යනු අජ්ජතනී විභත්ති විධාන සූත්‍රයි. සමීපෙ-අද පටන් සමීපවූ ප්‍රත්‍යක්ෂවූ හෝ නුවූ අතීත කාලයෙහි; අජ්ජතනී-අජ්ජතනී විභත්තිය වේ.

**කත්තෘකාරක පරස්සපද රූපයෙහි**

| | | | | |
|---|---|---|---|---|
| අපචි පචි<br>අපචී පචී | (අද පටන් | සමීප | අතීතයෙහි) | පිසුවේය. |
| අපචිංසු<br>අපචුං | ,, | ,, | ,, | පිසුවාහුය |
| අපචො | ,, | ,, | ,, | පිසුවෙහි |
| අපචිත්ථ | ,, | ,, | ,, | පිසුවහු |
| අපචිං | ,, | ,, | ,, | පිසුවෙමි |
| අපචිම්හා | ,, | ,, | ,, | පිසුවෙමු |

කත්තෘකාරක ආත්මනෙ පදයද මෙසේමැයි

**කම්මකාරක පරස්සපද රූපයෙහි**

| | | | |
|---|---|---|---|
| අපච්චි අපච්චි | (අද පටන් සමීප | අතීතයෙහි) | පිසනු ලැබී |
| අපච්චිංසු අපච්චුං | ,, | ,, | පිසනු ලැබූ |
| අපච්චො | ,, | ,, | පිසනු ලැබුවෙහි |
| අපච්චිත්ථ | ,, | ,, | පිසනු ලැබුවහු |
| අපච්චිං | ,, | ,, | පිසනු ලැබුවෙමි |
| අපච්චිම්හා | ,, | ,, | පිසනු ලැබුවෙමු |

කම්මකාරක ආත්මනෙ පදයද මෙසේ මැයි.

භාවෙ-භාවකාරකයෙහි; අභූයි භූයි අභූයා භූයා-(අද පටන් සමීප අතීතයෙහි) වීමයි.

විස්තර:-

අජ්ජ භවා අජ්ජතනී-අද වූවා අජ්ජතනී නම්. තද්දුපචාර වශයෙන් අද පටන් සමීප අතීතයෙහි වූ දෙය හඟවන ක්‍රියාවයි. එයද හියත්තනිය මෙන් ප්‍රත්‍යක්ෂ වූ හෝ නුවූ ක්‍රියාවක් සඳහා යොදනු ලැබේ.

මේ ක්‍රියාව අද පටන් සමීප අතීතයෙහි ලැබේ. මෙහි "අද" යන්නෙන් සඳහන්වන කාලය කෙසේ පිරිසිඳිය යුතුදයත්? ලෝක ව්‍යවහාරයෙහි අරුණෝදය හෝ සූර්යෝදය කාලය පටන් අතික් අරුණෝදය හෝ සූර්යෝදය කාලය දක්වා අද යයි කියනු ලැබේ. වෛයාකරණයන්ගේ මතයෙහි වනාහි මේ අජ්ජතනිය පිළිබඳ අජ්ජ (අද) යන්නෙහි පරිච්ඡේදය කිප ආකාරයකින් දක්නා ලැබේ

"අහස්සුභයතො අඩ්ඪ—රත්තං වා තදුපඩ්ඪකං"
අතෙතා කච්චාන විසෙසුදයෙත්‍ය—අහො අජ්ජතනො ඉති"

යනුවෙන් ගතවූ රාත්‍රියේ පසළොස් පැයක් හෝ එයින් අඩියක් (සත් පැ සමාරක්) පටන් ඉෂට දින රාත්‍රි පසළොස් පැයක් හෝ එයින් අඩියක් දක්වා කාලය අද දවසයයි දක්වනලදි.

පච්ඡිමොතීත රත්තියා—යාමෝ අඩ්ඪමමුස්ස වා
කාලො සියා'ත්‍යජ්ජතනො වෙය්‍යාකරණ දස්සනං

යනුවෙන් ගතවූ රාත්‍රියේ පශ්චිම යාමය හෝ එයින් අඩියක් හෝ කාලය අද දිනයට ඇතුළතැයි ද කියනු ලැබේ. මෙයින් ඊයේ රැයින් දස පැයක් හෝ පස් පැයක් හෝ පටන් අද දවස ගිණිය යුතුයයි දක්වත්

තවත් ආචාර්‍ය්‍ය කෙනෙකුන්ගේ මතය ලෙස ගතවූ රාත්‍රියේ තුන්පැ පන්සාළිස් විනාඩිකාවක් (3¾) පටන් අද රාත්‍රි එපමණ කාලය දක්වා අද දිනයට ඇතුළත්යයි පෙනේ.

මෙහි දැක්වූ පරිදි අද්‍යතනය (අද දිනය) පිළිබඳ මතාන්තර පසක් දක්නා ලැබේ එනම්:-ඊයේ රැයින් (i) පසළොස් පැයක් හෝ, (ii) දස පැයක් හෝ (iii) සත්පැ සමාරක් හෝ, (iv) පස් පැයක් හෝ, (v) තුන් පැ පන්සාළිස් විනාඩිකාවක් හෝ අද දින යට ඇතුළත්වේය යනුයි.

මෙකී වෛයාකරණ මතයන්ගෙන් පිරිසුන් කාලය අද දිනයයි. ඒ අද දිනය පටන් සමීප අතීත කාලය ප්‍රකාශ කරන ක්‍රියාව අජ්ජ තනී විභක්තියයි. මෙසෙයින් අද දිනය හිමිවූ කල්හි එයින් ඔබ්

බෙහි වූ දිනය (ඊයේ) පටන් පැවති ක්‍රියාව හීයත්තනී විභක්ති යෙන් යෙදේ. මේ මෙසේ වුවද භාෂා ව්‍යවහාරයෙහි නම් මේ කාල නියමය ගැන නොසලකා සාමාන්‍ය අතීතයෙහි අවිශෙෂ යෙන් මේ(හියත්තනී අජ්ජතනී)විභක්ති දෙක කිසිතැනෙක යොද තිබෙන බවද සැලකිය යුතුයි.

හෙළුබසෙහි මේ අජ්ජතනිය සඳහා සාමාන්‍ය අතීතකාලික ක්‍රියාව මිස විශෙෂ ක්‍රියාවක් නැත්තේය. එහෙයින් හෙළුවෙහිදී අජ්ජතනී විභක්ත්‍යර්ථය දීම පිණිස **"අද පටන් සමීප අතීතයෙහි"** යනු යොදන්ට වෙයි.

ප්‍රතිෂෙධාර්ථයෙහිවූ "මා" යන නිපාතය යෙදෙන කල්හි මේ හීයත්තනී අජ්ජතනී විභක්ති දෙක වර්තමානාදි සියලු කල්හි වෙයි. පඤ්චමියද එසේ වන බව දක්වන ලදි. **මා අගමා**-නොයව, **මා භායි**-බය නොවව, **මා තෙ භවතු** අන්තරායො-තට අන්තරා යක් නොවේවා යනු උදාහරණයි.

---

## 7. භවිස්සන්ති විභත්තිය

"භවිස්සන්ති ස්සති ස්සන්ති ස්සසි ස්සථ ස්සාමි ස්සාම-ස්සතෙ ස්සන්තෙ ස්සසෙ ස්සවෙහ ස්සං ස්සාමෙහ" යන සූත්‍රයෙන් ස්සති ස්සන්ති යනාදි ප්‍රත්‍යය දොළොස භවිස්සන්ති විභක්ති නම් වේ.

**"අනාගතෙ භවිස්සන්ති"** යනු භවිස්සන්ති විභක්ති විධාන සූත්‍රයි. අනාගතෙ-අනාගත කාලයෙහි; භවිස්සන්ති-භවිස්සන්ති විභක්තිය වේ.

**කර්තෘකාරක පරස්සපද පදයෙහි**

පවිස්සති - (මතු) පිසන්නේය පවිස්සන්ති- (මතු) පිසන්නාහුය.
පවිස්සසි - (මතු) පිසන්නෙහි පවිස්සථ - (මතු) පිසන්නහු
පවිස්සාමි- (මතු)පිසන්නෙමි පවිස්සාම - (මතු) පිසන්නෙමු

කර්තෘකාරක ආත්මනෙ පදයද මෙසේමැයි.

**කර්මකාරක පරස්සපද පදයෙහි**

පච්චිස්සති -(මතු) පිසනු ලබන්නේය
පච්චිස්සන්ති - (මතු)පිසනු ලබන්නාහුය
පච්චිස්සසි -(මතු) පිසනු ලබන්නෙහි
පච්චිස්සථ - (මතු) පිසනු ලබන්නහු
පච්චිස්සාමි-(මතු) පිසනු ලබන්නෙමි
පච්චිස්සාම - (මතු) පිසනු ලබන්නෙමු

කර්මකාරක ආත්මනෙ පදයද මෙසේමැයි.

භාවෙ-භාවකාරකයෙහි;භූයිස්සති භූයිස්සතෙ-(අනාගතයෙහි) වීමයි.

---

විස්තර:-

අනාගත (නොපැමිණි-මතු) කාලය ප්‍රකාශ කරන ක්‍රියාව භවිස්සන්ති විභක්තියෙන් කියත්. අතීත කාලයද අනාගතය කොට කියනු කැමති කල්හි අතීතාර්ථයෙහි භවිස්සන්ති විභක්තිය වේ. "අනෙක ජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං" යනු උදාහරණයි. මෙහි සන්ධාවිස්සං යනු අතීතාර්ථයෙහි භවිස්සන්තියයි කියන ලදි. නමුත් මේ මතය ඇතැම් ආචාර්‍ය්‍ය කෙනෙක් බැහැර කෙරෙති. **සන්ධාවිස්සං-උපොසථං උපවසිස්සං** යනාදිය අතීතාර්ථයෙහි අනාගතය නොව (තනිකර) අතීතයම බව ශබ්දනීති කාර **ආචාර්‍ය්‍යයෝ** දක්වති. සන්ධාවිං-උපවසිං යී සිටියයුතු තැන ඉං විභක්තියට ඉස්සං ආදෙශයවී සන්ධාවිස්සං- උපවසිස්සිං යී සිඬවන බව එහි දක්වා තිබේ.

නින්දාවක් හෝ ආශ්චර්‍ය්‍යයක් හැඟවුවමනා තැන"කථංහි නාම" හෝ "නාම" යන නිපාතයන්ගේ යොගයෙහි අතීතාර්ථය සඳහාද අනාගතාය (භවිස්සන්ති විභක්තිය) යෙදේ

නින්දා-කථංහි නාම භවා මොඝ පුරිස උදරස්ස කාරණා **පබ්බජිස්සසි**
„ සාපි නාම පචිස්සති (ඇත් පිසන්නීද?)
„ ඉමෙ හි නාම කල්‍යාණ ධම්මා පටිජානිස්සන්ති
ආශ්චර්‍ය්‍ය-අච්ඡරියං අන්ධො නාම පබ්බතමාරොහිස්සති
„ කථං හි නාම සො තත්ථ ගමිස්සති
යනාදිය උදාහරණයි.

සංශය (සැක) යක් හඟවන තන්හිද වර්‍තමානාර්ථයෙහි අනාගත විභක්තිය යෙදේ. **එසා පෙකා** පුව විකති **භවිස්සති**- (මෝතොමෝත් එක් කැඩුම් විකෘතියක් (වර්‍ගයක්) වන්නීය යනු උදාහරණයි.

---

## 8. කාලාතිපත්ති විභක්තිය.

"කාලාතිපත්ති ස්සා ස්සංසු ස්සෙ ස්සථ ස්සං ස්සම්හා-ස්සථ ස්සිංසු ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාම්හසෙ" යන සූත්‍රයෙන් ස්සා ස්සංසු යනාදි ප්‍රත්‍යය දෙළොස කාලාතිපත්ති විභක්ති නම් වේ.

**"ක්‍රියාතිපන්නෙ'තීතෙ කාලාතිපත්ති"** යනු කාලාතිපත්ති විභක්ති විධාන සූත්‍රයි. ක්‍රියාතිපන්නෙ, ක්‍රියාවගේ සිඬ නොවීම් මාත්‍රවූ; අතීතෙ-අතීත කාලාර්ථයෙහි; කාලාතිපත්ති-කාලාතිපත්ති විභක්තිය වේ.

### කත්තෘකාරක පරස්සපද පදයෙහි

| | | | | |
|---|---|---|---|---|
| අපවිස්සා | – සහල් ආදි උපකාරණ | | ලැබුවේ නම් | පිසුවේය |
| අපවිස්සංසු – | ,, | ,, | ලැබුවාහු නම් | පිසුවාහුය |
| අපවිස්සෙ – | ,, | ,, | ලැබුවෙහි නම් | පිසුවෙහි |
| අපවිස්සථ – | ,, | ,, | ලැබුවහු නම් | පිසුවහු |
| අපවිස්සං – | ,, | ,, | ලැබුවෙම් නම් | පිසුවෙමි |
| අපවිස්සම්හා – | ,, | ,, | ලැබුවෙමු නම් | පිසුවෙමු |

කත්තෘ කාරක ආත්මනෙ පදයද මෙසේමැයි.

### කර්මකාරක පරස්සපද පදයෙහි

| | | | | |
|---|---|---|---|---|
| අපච්චිස්සා– | සහල් ආදි උපකාරණ | | ලද්දේ නම් | පිසනුලැබුවේය |
| අපච්චිස්සංසු– | ,, | ,, | ලද්දහු නම් | පිසනුලැබුවාහුය |
| අපච්චිස්සෙ– | ,, | ,, | ලද්දෙහි නම් | පිසනුලැබුවෙහි |
| අපච්චිස්සථ – | ,, | ,, | ලද්දහු නම් | පිසනුලැබුවහු |
| අපච්චිස්සං – | ,, | , | ලද්දෙම් නම් | පිසනුලැබුවෙමි |
| අපච්චිස්සම්හා– | , | ,, | ලද්දෙමු නම් | පිසනුලැබුවෙමු |

කර්මකාරක ආත්මනෙ පදයද මෙසේමැයි.

භාවේ– භාවකාරකයෙහි; අභූයිස්සා අභූයිස්සථ– (කාරණ වෛකල්‍යයක් නොවී නම්) විමයි.

---

**විස්තර:–**

අතිපතනං අතිපත්ති, කාලස්ස අතිපත්ති කාලාතිපත්ති. ඉක්ම යෑම අතිපත්ති නමි. ක්‍රියාවගේ ඉක්ම යෑම (සිඩ නොවීම) කාලාතිපත්ති නමි. විරුඬ කාරණයකගේ ඇතිවීම නිසා හෝ ක්‍රියාව සිඩවියයුතු හෙතුවකගේ නැතිවීම (වැළකීම) නිසා හෝ ක්‍රියාව සිදු නොවීම මේ කාලාතිපත්ති විභක්තියෙන් දක්වයි. එය අතීත ක්‍රියාවකි. සහල් ආදි උපකරණ ලැබුවේ නම් බත පිසුවේය යන මෙහි උපකාරණ සංඛ්‍යාත හෙතුව නොලැබුණි නම් බත පිසීම් සංඛ්‍යාත ඵලයද නොලැබෙන්නේයයි හඟවන හෙයින් කාලාතිපත්ත්‍යර්ථය ලැබේ.

කාලාතිපත්ති විභක්ති යුක්ත වාක්‍යය චෙ, සචෙ, යදි යන අනියමාර්ථ ප්‍රකාශ නිපාතයක් හා හෙතු ක්‍රියා යුක්ත අනන්තර්වාක්‍යයක්ද පූර්ණ කොට යොදනු ලැබේ. සචෙ සො යානං අලභිස්සා; නගරං අගච්ඡිස්සා යනු උදාහරණයි, එසේ හෙයින්

සචෙ තණ්ඩුලාදි සාධනං අලභිස්සා සො ඔදනං අපචිස්සා
,, ,, ,, අලභිස්සංසු තෙ ,, අපචිස්සංසු
යනාදි වශයෙන් පච ධාතුවට අරුත් බිණියයුතු.

මෙයින් කාලාතිපත්ති විභක්තියට වාක්‍ය දෙකක හෙතු ක්‍රියා ඵල ක්‍රියා වශයෙන් ක්‍රියා දෙකක් යෙදෙන බව සැලකිය යුතුයි. මේ ක්‍රියාපද දෙක සමහර තන්හි කාලාතිපත්ති විභක්තියෙන්ද, ඇතැම් තැනෙක පූර්ව වාක්‍යයෙහි වූ ක්‍රියාව පඤ්චමියෙන් හා අනික කාලාතිපත්ති විභක්තියෙන්ද යෙදෙන බව පෙනේ. ඇතැම් තන්හි පූර්වය කාලාතිපත්තියෙන් හා අපරය පඤ්චමියෙන්ද යෙදේ.

"සචෙ තබ්බිරුඩං න භවෙය්‍ය, ඔදනං අපචිස්සා"
"නොචෙ තං භික්ඛවෙ සක්කා අභවිස්ස අකුසලං පජහිතුං
නාහං එවං වදෙය්‍යං" යනාදිය සලකනු.

මේ කාලාතිපත්තිය අතීතාර්ථයෙහි පමණක් නොව අනාගතාර්ථයෙහිද වන බව මෞද්ගල්‍යායනාචාර්යයන්ගේ මතයයි. පාණිනීයාදි සංස්කෘත වෛයාකරණයන්ටද එසේම අභිමතය. දක්ඛිණෙන චෙ අගමිස්සා න සකටං පරියාභවිස්සා—(ඉදින් දකුණෙන් යන්නේ නම් ගැල නොපෙරළෙන්නේය) යනු අනාගත කාලාතිපත්තියට උදාහරණ කොට එහි දක්වන ලදි. වර්තමාන කාලාතිපත්තියක් නම් නැත්තේය.

අෂ්ට විභක්ති නිමි.

---

## හෙත්වර්ථ ක්‍රියා

"ධාතූහි ණෙ ණය ණාපෙ ණාපයා කාරිතානි හෙත්වත්ථෙ" යනු ණෙ ආදි ප්‍රත්‍යය විධාන හා කාරිත සංඥා සූත්‍රයි. හෙත්වත්ථෙ, හෙත්වර්ථයක් හැඟෙන කල්හි; ධාතූහි-ධාතූන් කෙරෙන්; ණෙ ණය ණාපෙ ණාපයා-ණෙ ණය ණාපෙ ණාපය යන ප්‍රත්‍යයෝ වෙත්; කාරිතානි-ඔව්හු කාරිත සංඥා ඇත්තාහුද වෙත්.

### වර්තමාන විභක්තිය

කර්තෘකාරක පරස්මෛ පදයෙහි-ණෙ ප්‍රත්‍යයෙහි,

| | | |
|---|---|---|
| සො-හෙතෙම; | සූදෙන-අරක්කැමියා ලවා; | ඔදනං-බත පාචෙති-පිසවයි |
| තෙ-ඔහුතුමූ; | ,, | ,, පාචෙන්ති පිසවත් |
| ත්වං-තෝ; | ,, | ,, පාචෙසි-පිසවහි |
| තුම්හෙ-තොපි; | ,, | ,, පාචෙථ-පිසවහු |
| අහං-මම; | ,, | ,, පාචෙමි-පිසවමි |
| මයං-අපි; | ,, | ,, පාචෙම-පිසවමු |

කර්තෘකාරක ආත්මනෙ පදයෙහි

| | |
|---|---|
| පාවෙතෙ-පිසවයි | පාවෙන්තෙ - පිසවත් |
| පාවෙසෙ-පිසවහි | පාවෙවෙහ - පිසවහු |
| පාවෙ -පිසවමි | පාවෙමෙහ - පිසවමු |

ණය ප්‍රත්‍යය-ණාපෙ ප්‍රත්‍යය-ණාපය ප්‍රත්‍යය යන මොවුන් යෙදූන කල්හිද මේ අර්ථ ම දතයුතුයි.

කර්ම කාරක පරස්සෙම පදයෙහි

| | |
|---|---|
| පාචියති - පිසවනු ලැබේ | පාචියන්ති - පිසවනු ලැබෙත් |
| පාචියසි - පිසවනු ලැබෙහි | පාචියථ - පිසවනු ලබහු |
| පාචියාමි - පිසවනු ලබමි | පාචියාම - පිසවනු ලබමු |

ආත්මනෙ පදයෙහිද මේ අර්ථ මැයි.

ණය-ණාපෙ-ණාපය ප්‍රත්‍යයන්හිද මෙසේම දතයුතුයි.

---

### පඤ්චමී විභක්තිය.

(මෙහි වනාහි ප්‍රථම පුරුෂය පමණක් කියන්නෙමු. ඒ නයින් සෙසු පුරුෂයෝත් දතයුතුයහ.)

කර්තෘ කාරක පරස්සෙම පදයෙහි

| | |
|---|---|
| පාවෙතු - පිසවාවා | පාවෙන්තු - පිසවත්වා |
| පාචයතු - ,, | පාචයන්තු - ,, |
| පාචාපෙතු - ,, | පාචාපෙන්තු- ,, |
| පාචාපයතු - ,, | පාචාපයන්තු- ,, |

ආත්මනෙ පදයද මෙසේ මැයි.

කර්ම කාරක පරස්සෙම පදයෙහි

පාචියතු-පිසවනු ලැබේවා පාචියන්තු-පිසවනු ලැබෙත්වා සෙස්සද මෙසේ මැයි.

මේ ක්‍රමයෙන් සප්තමී ආදි අනික් විභක්තීන්හිද දතයුතුයි.

**විස්තර:-**

තමා ප්‍රධානව ක්‍රියාව කරන තැනැත්තේ (ශුද්ධ) කර්තෘ නම් "යො කරෙති සකත්තා" යනුවෙන් එය දක්වන ලදි. "යො කාරෙති සහෙතු" යන්නෙන් යමෙක් කිසිවෙකු ලවා ක්‍රියාව ක

වාද හෙතෙම **හෙතු** කර්තෘ නමැයි කියනලදී. අනිකෙකු ලවා ක්‍රියාව කරවන තැනැත්තේ හෙතු කර්තෘ යයි කී තියායි. මේ ක්‍රියාවට **කාරිත ක්‍රියා** යයිද නමක් වේ.

අනිකෙකු ලවා කරවන මෙබඳු ක්‍රියාවක් හැඟවුවමනා තැන පාළියෙහි **ණෙ, ණය, ණාපෙ, ණාපය,** යන ප්‍රත්‍යය සතරක් දක්වයි. එය ධාතුවෙන් පරව යෙදේ. එහිවූ **ණ** කාරය අසංයොගාන්ත ධාතුවට වෘද්ධි කිරීම ප්‍රයොජන කොට ඇත්තේය. එබැවින් එය ලොප් වූ කල්හි ප්‍රත්‍යයට ඉතුරු වන්නේ **එ-අය-ආපෙ-ආපය** යනු පමණෙකි. ඉන් පරව විභක්ති (ප්‍රත්‍යය) යොදනු ලැබේ.

පච ධාතුව පිළිබඳව මේ ප්‍රත්‍යය සතරම යෙදුන නමුත් සියලු ධාතූන් විෂයෙහි එසේ නොවේ. ඒ සම්බන්ධ නියමය මෙසේයි

“ණෙ ණයාව උවණ්ණන්තා–ආතො වෙ පච්ඡිමා සියුං
සෙසතො චතුරෙ වෙවා–වා සද්දස්සා’නුවත්තිතො”

“ධාතුහි ණෙණයාදි” සූත්‍රයට වැටුණු වා ශබ්දයාගේ බලයෙන් උවර්ණාන්ත ධාතූන් කෙරෙන් ණෙ ණය යන ප්‍රත්‍යය දෙකම වේ. ආකාරාන්ත ධාතූන් කෙරෙන් ණාපෙ ණාපය යන ප්‍රත්‍යය දෙකවේ. සෙසු අකාරාන්ත ඉවර්ණාන්තාදි ධාතූන් කෙරෙන් සතරම හෝ දෙකක් හෝ යෙදේ.

සු ධාතුව උකාරාන්ත බැවින් ණෙ ණය ප්‍රත්‍යය ලැබ කාරිතයෙහි සාවෙති සාවයති යනු වේ. දා ධාතුව ආකාරාන්ත බැවින් ණාපෙ ණාපය ප්‍රත්‍යයව දාපෙති දාපයති යනු වේ.

කාරිතයෙහිදී අකර්මක ධාතුහු සකර්මක වෙත්. සකර්මක ධාතුහු ද්විකර්මක වෙත්. ද්විකර්මක ධාතුහු ත්‍රිකර්මක වෙත්. කාරිතයවූ කල්හි පූර්ව වාක්‍යයෙහිවූ ශුද්ධ කර්තෘපදය කර්මය වෙයි.

අකර්මක වාක්‍යය–දාරකො සයති
සකර්මක වූ පරිදි–මාතා **දාරකං** සයාපෙති
සකර්මක වාක්‍යය–දාරකො ඛීරං පිබති
ද්විකර්මක වූ පරිදි–මාතා **දාරකං ඛීරං** පායෙති
ද්විකර්මක වාක්‍යය–දාසො **භාරං ගාමං** නයති
ත්‍රිකර්මක වූ පරිදි–සාමි **දාසං භාරං ගාමං** නයාපෙති

පූර්ව වාක්‍යයෙහිවූ ශුද්ධ කර්තෘ කාරිතයෙහිදී කර්මය වුවත් ගමනාර්ථ, අවබොධාර්ථ, භොජනාර්ථ, පඨනාර්ථ ආදි ධාතූන්ගේ යොගයෙහි විකල්පයෙන් තෘතියාවෙන්ද සිටින බව දක්වන ලදී. සාමි **දාසෙන** භාරං ගාමං නයාපෙති යනාදි වශයෙනි.

**හෙත්වර්ථ ක්‍රියා නිමි.**

ඉක්බිති ගමු ධාතුවගේ ද රූපමාලාව දක්වනු ලැබේ. ගමු ධාතුව ගමනාර්‍ථයෙහි වේ. සියලු විභක්තින්හි ගච්ඡ යන ක්‍රියාඞ්ගය ලැබේ.

## වත්තමාන විභත්තිය

ගච්ඡති-ගච්ඡතෙ-යයි.

ගච්ඡීයති-ගච්ඡීයතෙ-යනු ලැබේ

යනාදි වශයෙන් උක්තානුසාරයෙන් පදාර්‍ථ දතයුතුයි.

**පඤ්චමී**-ගච්ඡතු-යේවා, ගච්ඡීයතු-යනු ලැබේවා

**සත්තමී**-ගච්ඡෙ ගච්ඡෙය්‍ය-යන්නේය ගච්ඡීයෙ-ගච්ඡීයෙය්‍ය-යනු ලබන්නේය

**පරොක්ඛා**-ජගාම ජගම-ගියේලු ජගාමිය ජගමිය-යන ලද්දේලු

**හීයත්තනී**-අගච්ඡා-(ඊයේ පටන් අතීතයෙහි) ගියේය

අගච්ඡීයා-(ඊයේ පටන් අතීතයෙහි) යන ලද්දේය

**අජ්ජතනී**-අගච්ඡි අගච්ඡී-(අදපටන් සමීප අතීතයෙහි) ගියේය

අගච්ඡීයි (අදපටන් සමීප අතීතයෙහි) යන ලද්දේය

**භවිස්සන්තී**-ගච්ඡිස්සති-(මතු) යන්නේය

ගච්ඡීයිස්සති-(මතු) යනු ලබන්නේය

**කාලාතිපත්ති**-අගච්ඡිස්සා-(යනාදියක් ලැබී නම්) ගියේය

අගච්ඡීයිස්සා-(යානාදියක් ලද්දේනම්) යන ලද්දේය.

---

## ගණභෙදය

1 **භූසත්තායං**- භූ යන ධාතුව වීමෙහි වේ. භවති-වෙයි; භවන්ති-වෙත්; ඉච්චාදි-යනාදිය වේ. භූවාදි-භූවාදි ධාතු ගණයයි.

2 **රුධි ආවරණෙ**-රුධි යන ධාතුව වැලැකීමෙහි වේ. රුන්ධති-වලකයි; රුන්ධන්ති-වලකත්; ඉච්චාද-යනාදියවේ. රුධාදි-රුධාදි ධාතුගණයයි.

3 **දිවුකීළාදිමහි**-දිවු යන ධාතුව ක්‍රීඩාදියෙහි වේ. දිබ්බති-ක්‍රීඩා කරයි; දිබ්බන්ති-ක්‍රීඩා කරත්; ඉච්චාදි යනාදියවේ. දිවාදි-දිවාදි ධාතුගණයයි.

4 **සු සවණෙ**-සු යන ධාතුව ඇසීමෙහි වේ. සුණොති-අසයි; සුණන්ති-අසත්; ඉච්චාදි-යනාදියවේ. සවාදි-සවාදි ධාතු ගණයයි.

**5 කී දබ්බවිනිමයෙ**-කී යන ධාතුව ද්‍රව්‍ය ගනුදෙනුවෙහි වේ. කිණාති-මිලදී ගනියි; කිණන්ති-මිලදී ගනිත්; ඉත්‍යාදි-යනාදියවේ. කියාදි-කියාදි ධාතු ගණයයි.

**6 ගහ උපාදානෙ**-ගහ යන ධාතුව ගැනීමෙහි වේ. ගණ්හාති-ගනියි; ගණ්හන්ති-ගනිත්; ඉත්‍යාදි-යනාදිය වේ. ගහාදි-ධාතු ගණයයි.

**7 තනු විත්‍ථාරෙ**-තනු යන ධාතුව පැතිරවීමෙහිවේ. තනොති-පතුරුවයි; තනොන්ති- පතුරුවත්; ඉත්‍යාදි-යනාදිය වේ. තනාදි-තනාදි ධාතුගණයයි.

**8 චුර ථෙය්‍යෙ**-චුර යන ධාතුව සොරකමෙහිවේ. චොරෙති-සොරකම් කරයි; චොරෙන්ති-සොරකම් කරත්; ඉත්‍යාදි-යනාදිය වේ. චුරාදි-චුරාදි ධාතු ගණයයි.

---

### විකරණ ප්‍රත්‍යයයෝ

1 භූවාදිතො අ-භූවාදි ගණයා කෙරෙන්පරව අ ප්‍රත්‍යය වේ.

2 රුධාදිතො නිග්ගහීත පුබ්බඤ්ච-රුධාදිගණයා කෙරෙන් පරව අ ප්‍රත්‍යය වේ. නිග්ගහීතයක්ද ඊට පූර්ව ආගම වේ.

3 දිවාදිතො යො—දිවාදි ගණයා කෙරෙන් පරව ය ප්‍රත්‍යය වේ.

4 සවාදිතො ණු ණා උණා ච-සවාදිගණයා කෙරෙන් පරව ණු-ණා-උණා යන ප්‍රත්‍යයයෝ වෙත්.

5 කියාදිතො නා-කියාදිගණයා කෙරෙන් පරව නා ප්‍රත්‍යය වේ.

6 ගහාදිතො ප්ප ණ්හා-ගහාදි ගණයා කෙරෙන් පරව ප්ප-ණ්හා යන ප්‍රත්‍යයයෝ වෙත්.

7 තනාදිතො ඔ යිරා-තනාදි ගණයා කෙරෙන් පරව ඔ-යිර යන ප්‍රත්‍යයයෝ වෙත්.

8 චුරාදිතො ණෙ ණයා-චුරාදි ගණයා කෙරෙන් පරව ණෙ-ණය යන ප්‍රත්‍යයයෝ වෙත්.

---

## ආඛ්‍යාතය

**යං තිකාලං තිපුරිසං-ක්‍රියාවාචි තිකාරකං**
**අතිලිඞ්ගං ද්විවචනං-තදාඛ්‍යාතන්ති වුච්චති.**

යං–යම් පදයක් තෙම; තිකාලං–කාලත්‍රයක් ඇත්තේද; තිපුරිසං පුරුෂත්‍රයක් ඇත්තේද; ක්‍රියාවාචී ක්‍රියාවක් ප්‍රකාශ කරන සුලු වූයේද; තිකාරකං–කාරකත්‍රයක් ඇත්තේද; අත්තිලිඞ්ගං–ලිඞ්ගත්‍රය (භෙද)යක් නැත්තේද; ද්විවචනං–වචනද්වයක් ඇත්තේද; තං– ඒ පදය තෙම; ආඛ්‍යාතං ඉති–ආඛ්‍යාත යයි; වුච්චති–කියනු ලැබේ.

ආඛ්‍යාතය යනු කුමක්දැයි යථොක්ත ගාථාවෙන් දක්වන ලදි. කාල කාරකාදිය ප්‍රකාශකරන ක්‍රියා වාචකවූ පදය ආඛ්‍යාත නම් වේ. එහි කාල තුනක් ඇත. පුරුෂ තුනක් ඇත. ක්‍රියාවාචකභාවයක් ඇත. කාරක තුනක් ඇත. ලිඞ්ග තුනක් නැත. වචන දෙකක් ඇත. මෙබඳු වූයේ ආඛ්‍යාතයයි.

| | | | |
|---|---|---|---|
| කාලත්‍රය | – | අතීත, වර්තමාන, අනාගත | යනුයි |
| පුරුෂත්‍රය | – | ප්‍රථම, මධ්‍යම, උත්තම | „ |
| කාරකත්‍රය | – | කර්තෘ, කර්ම, භාව | „ |
| වචනද්වය | – | ඒකවචන, බහු වචන | „ |

කාලය අතීතාදිවශයෙන් තුන්වැදෑරුම්. ආණත්ති, පරිකප්ප කාලාතිපත්ති යන අර්ථයන් සමග සවැදෑරුම් කොටද ඇතැම් කෙනෙක් දක්වත්. නමුත් හෙද අතීතාදි කාලත්‍රයෙහිම ඇතුළත් වේ.

ප්‍රථමාදි පුරුෂත්‍රය අතුරෙන් (තුම්හ අම්හ ශබ්ද වර්ජිත) නාමයක් හා යෙදුණු ක්‍රියාව ප්‍රථම පුරුෂ නම්. සූදො ඔදනං පචති යනු මෙනි. මෙහි පචති යන ක්‍රියාව සූද සංඛ්‍යාත නාම පදයක් හා යෙදුනේය. එහෙයින් පචති යනු ප්‍රථම පුරුෂයි. තුම්හ ශබ්දයා (ත්වං–තුම්හෙ යනු) හා යෙදුනේ මධ්‍යම පුරුෂයයි. ත්වං ඔදනං පචසි යනු උදාහරණයි. අම්හ ශබ්දයා (මම–අපි යනු) හා යෙදුනේ උත්තම පුරුෂයයි. අහං ඔදනං පචාමි යනු උදාහරණයි.

කර්තෘ, කර්ම, භාව වශයෙන් ආඛ්‍යාතය සම්බන්ධවූ කාරක තුනෙකි. කර්තෘ උක්තවන (කියවෙන) පරිදි යොදනලද ක්‍රියාව **කර්තෘකාරක** නම් වේ. සූදො ඔදනං පචති යන මෙහි පචති–පිසයි; කවරෙක් පිසාදැයි සොයන කල්හි සූදො පචති–සූදයා පිසා යයි හැඟේ. එබැවින් මේ පචති යන ක්‍රියාවෙන් කර්තෘ උක්තවෙයි. **කර්තෘ උක්තවූ කල්හි කර්මය අනුක්තවෙයි.** උක්ත කර්තෘ ප්‍රථමා විභක්තියෙන් සිටියි. අනුක්ත කර්මය ද්විතීයා විභක්තියෙන් සිටියි.

කර්මය උක්ත වන පරිදි යෙදූ ක්‍රියාව **කර්මකාරක** නම්. සූදෙ ඔදනං පචති යනු කර්තෘ කාරක වාක්‍යයක් බව යට කියන ලදී. එයම කර්මය උක්ත වන පරිදි යොදන කල්හි "සූදෙන ඔදනො පච්චති" යනු වේ පච්චති-පිසනු ලැබේ; කුමක් පිසනු ලැබේද? ඔදනො පච්චති-බත පිසනු ලැබේ. මෙහි පච්චති යන ක්‍රියාවෙන් උක්තවනුයේ (කියවනුයේ) ඔදනො යන කර්මයයි. කර්තෘ නොවේ. එවිට පච්චති යනු කර්මය උක්ත වන පරිදි යෙදූ ක්‍රියාවකි. එබැවින් එය කර්මකාරක නම් වේ. **කර්මය උක්තවූ කල්හි කර්තෘ අනුක්තවේ.** උක්ත කර්මය ප්‍රථමා විභක්තිය වේ. අනුක්ත කර්තෘ තෘතීයා විභක්තිය වෙයි.

ධාතුවේ අර්ථය පමණක් ප්‍රකාශ කරන ක්‍රියාව **භාවකාරක** නම්. එය කිරීම පමණක් හඟවයි. ධාත්වර්ථ මාත්‍රය කියවෙන ඒ ක්‍රියාව ප්‍රථම පුරුෂ ඒකවචනයෙහි පමණක් යෙදේ. තෙන භූයතෙ-ඔහු විසින් වීමයි. යනු උදාහරණයි. ඔහුගේ වීම යන අර්ථයි.

වචනවය සුබොධය. ඒකාර්ථයක් ප්‍රකාශ කරනුයේ ඒක වචන නම්. බහ්වර්ථයක් ප්‍රකාශ කරනුයේ බහුවචන නම්. සංස්කෘත යෙහි මෙන් ද්විවචනයක් මෙහි නැත.

## ත්‍රිවිධ ක්‍රියා

ක්‍රියා වනාහි තුන් අයුරකින් දක්නා ලැබේ. **ආඛ්‍යාත ක්‍රියා, කිතක ක්‍රියා, නෛපාතික ක්‍රියා** යන වශයෙනි. ගච්ඡති පචති යනාදිය ආඛ්‍යාත ක්‍රියා නම්. එහි ලක්ෂණ යට කියනලදී. ගතො, ගච්ඡන්තො, ගච්ඡමානො, ගන්තා, ගාමී යනාදිය කිතක ක්‍රියා නම් වේ. එය ක්‍රියාර්ථවත් නාම පදයි. තුන් ලිඟුවෙහි වරනැගේ. ගන්ත්වා, ගන්තුන යනාදිය නෛපාතික ක්‍රියායි. ක්‍රියාර්ථයක් ප්‍රකාශ කරනත් නිපාත සංඛ්‍යාවෙහි ඇතුළත් වේ. එහෙයින් වරනැඟීමක් නොලබයි.

## අෂ්ට විභක්ති

මෙකී ක්‍රියා අතුරෙන් ආඛ්‍යාත ක්‍රියාව භාෂාවේ අට අයුරකින් දක්නා ලැබේ. එනම්:-වර්තමාන, පඤ්චමී, සත්තමී, පරොක්ඛා, හීයත්තනී, අජ්ජතනී, භවිස්සන්ති, කාලාතිපත්ති යන අෂ්ට විභක්තීන්ගේ වශයෙනි. මේ එක් එක් විභක්තියක ප්‍රත්‍යය දෙළොස බැගින් විභක්ති අටෙහිම ප්‍රත්‍යය සානුවක් (96) වෙයි.

එයද කර්තෘකාරක කර්මකාරක වශයෙන් ද්විගුණිතවූ කල්හි 192 ක් වේ. එක් විභක්තියක කර්තෘකාරකයෙහි වූ ප්‍රත්‍යය දෙළොසින් පරස්සෙපද සයකි ආත්මනෙපද සයකි. කර්මකාරකයෙහිද මෙසේමය පරස්සෙපද සයින්හුදු ප්‍රථම පුරුෂ පද දෙකකි. මධ්‍යම පුරුෂ පද දෙකකි. උත්තම පුරුෂ පද දෙකකි. ඒ විකායන්ගෙනුදු එක් පදයක් එක වචනය. අනික බහුවචනය. ආත්මනෙ පද යෙහිද මෙසේමය.

## කාල විභාගය

මේ ආඛ්‍යාත විභක්ති අට කාල වශයෙන් අතීත වර්තමාන අනාගතයයි තුනකට බෙදනු ලැබේ.

වත්තමානා පච්චුප්පන්නෙ-භවිස්සන්ති අනාගතෙ
පඤ්චමී සත්තමී තිසු-අතීතෙ හොන්ති සෙසකා

යනුවෙන් දැක්වූ පරිදි වර්තමාන විභක්තිය වර්තමාන කාලයෙහි වේ. භවිස්සන්ති විභක්තිය අනාගත කාලයෙහි වේ. පඤ්චමී-සත්තමී දෙක කාලත්‍රයෙහි අනියමින් (හෝ කාල භෙදයක් නැතිව) වේ. පරොක්ඛා-හියත්තනී-අජ්ජතනි-කාලාතිපත්ති යන සතර අතීතයෙහි වේ. මෙහි පඤ්චමී සත්තමී දෙක කාලත්‍රයෙහි අනියමින් යෙදෙතැයි දක්වතත් අතීතයෙහි නොව වර්තමාන අනාගතාර්ථ දෙක්හි යෙදෙන බව හැගේ

කාලය වනාහි අතීත-වර්තමාන-අනාගත-ආණත්ති-පරිකප්ප-කාලාතිපත්ති වශයෙන් සවැදෑරුම් කොට ඇතැම් ආචාර්යයෝ නොහොතුන් බෙදන බව යට දක්වන ලදි. ඒ ක්‍රමයෙන්:-

| | | |
|---|---|---|
| පරොක්ඛා-හීයත්තනී-අජ්ජතනී තුන | — අතීත | කාලයෙහි වේ |
| වර්තමාන විභක්තිය | — වර්තමාන | ,, |
| භවිස්සන්ති ,, | — අනාගත | ,, |
| පඤ්චමී ,, | — ආණත්ති | ,, |
| සත්තමී ,, | — පරිකප්ප | ,, |
| කාලාතිපත්ති ,, | — කාලාතිපත්ති | ,, |

## පද විභාගය

**පචති** යනු වර්තමාන විභක්ති-කර්තෘකාරක-පරස්මෛපද-ප්‍රථම පුරුෂ-ඒකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියා පදයයි.

**පචන්ති** යනු වර්තමාන විභක්ති-කර්තෘකාරක-පරස්මෛපද-ප්‍රථම පුරුෂ-බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියා පදයයි.

**පචසි** යනු වර්තමාන විභක්ති-කර්තෘකාරක-පරස්මෛපද-මධ්‍යම පුරුෂ-ඒකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියා පදයයි.

**පචථ** යනු වර්තමාන විභක්ති-කර්තෘකාරක-පරස්මෛපද-මධ්‍යම පුරුෂ-බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියා පදයයි.

**පචාමි** යනු වර්තමාන විභක්ති-කර්තෘකාරක-පරස්මෛපද-උත්තම පුරුෂ-ඒකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියා පදයයි.

**පචාම** යනු වර්තමාන විභක්ති-කර්තෘකාරක-පරස්මෛපද-උත්තම පුරුෂ-බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියා පදයයි.

මෙසේ සෙසු විභක්තීන්හිද එක් එක් පදයක් පාසා විභක්ති කාරක-පද-පුරුෂ-වචන යොදමින් ඒ ඒ තැනට සුදුසු පරිද්දෙන් පද විභාගය දතයුතුයි.

-- නිමි --

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු